වාර්ෂික වාර්තාව 2022

வருடாந்த அறிக்கை 2022

ANNUAL REPORT 2022









ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

பாதுகாப்பு சேவை கட்டளை மற்றும் பதவிநிலை கலலூரி

Defence Services Command and Staff College

වාර්ෂික වාර්තාව

2022

සේනාවිධායක තුමාගේ පණිවිඩය



1. 2022 වර්ෂය සඳහා වන ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහි වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කිරීමේ අරමුණ වන්නේ මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක 16 සාර්ථකව පැවැත්වීම සඳහා දරනු ලැබූ ප්‍රයත්නය ඇගයීමට ලක් කිරීමයි. එම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා උපදේශක හා නිත්‍ය කාර්ය මණ්ඩලයෙහි දායකත්වය මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතු වන අතර ඉදිරි වර්ෂවලදීත් එම දායකත්වය මම එලෙසින්ම අපේක්ෂා කරමි.

2. 2022 වර්ෂය විද්‍යාලයේ අප සියළුම දෙනාටම අභියෝගාත්මක මෙන්ම වැදගත් සිද්ධීන්ගෙන් පිරුණු වසරක් විය. කොරෝනා වෛරසය හේතුවෙන් වර්ෂයේ ප්‍රථම අඩවසර තුළ විද්‍යාලීය වාර්ෂික සැලසුම්වලට බාධා ඇතිවූ නමුදු නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් එම කාර්යයන් සියල්ලම සාර්ථකව ඉටුකර ගැනීමට අපට හැකිවිය. වර්ෂයේ ප්‍රථම අඩවසර තුළ අනුගමනය කළ ජෛව බුබුළු සංකල්පය හා මාර්ගස්ථ දේශන ක්‍රමවේදය මඟින් දේශීය හා විදේශීය සිසුන්ද අපේක්ෂා කළ පරිද්දෙන්ම කිසිදු බාධාවකින් තොරව පාඨමාලාව පවත්වාගෙන යාමට හැකිවූ අතර, දෙවන අඩවසර තුළ කොරෝනා වෛරසය ව්‍යාප්තිය පහව යාමත් සමග පාඨමාලාවේ සැලසුම් හා කාලසටහන් ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීමටත් ආරාධිත දේශන සඳහා අවශ්‍ය දේශකයන් විද්‍යාලය වෙත ගෙන්වා ගැනීමටත් හැකිවීම තුළින් පාඨමාලාව ඉතා උසස් හා ගුණාත්මක භාවයකින් යුතුව හැදෑරීමට ශිෂ්‍ය නිලධාරීන් හට අවස්ථාව හිමිවිය. වසරේ අවසාන වැඩසටහන වන උපාධි ප්‍රදානෝත්සවය 2022.12.08 වන දින කොළඹ නෙලුම් පොකුණ මඟින්ද රාජපක්ෂ රඟහලේදී අති උත්කර්ෂවත් හා ගාම්භීර ලෙස පැවැත්වුණු අතර ඒ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා සහභාගී වූ අතර එම උත්සවය ඉතා සාර්ථකව සිදුකිරීමට හැකි වීම පිළිබඳ විද්‍යාලීය සේනාවිධායක වශයෙන් මා ඉතා නිහතමානීව සතුටට පත්වෙමි.

3. ඉදිරි වර්ෂවලදී ද යහපත් හා සාර්ථක ප්‍රතිඵල ළඟාකර ගැනීමට සහ පවතින තත්වය තුළ උවද නව්‍යතම ක්‍රියාකාරකම් සිදු කිරීමට අප අපේක්ෂා කරන්නෙමු. එම නව ක්‍රියාකාරකම් සඳහා පෙර වසර වලදී සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය අවශ්‍ය වන බව පැහැදිලිය. ඒ සඳහා මෙම වාර්තාව මඟින් පෙර වසර තුළ මානව, මුල්‍ය ද්‍රව්‍යමය හා කාලය යන සාධක කාර්යක්ෂම කළමණාකරනය කළ ආකාරය පිළිබඳව විග්‍රහයක් සපයනු ලැබේ. එබැවින් මෙම වාර්තාව මඟින් විද්‍යාලයීය හර පද්ධතිය ඇතුළත්ව එහි දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කරගත් ආකාරය පිළිබඳ වෘත්තීයමය අවබෝධයක් ලබාදෙනු ඇත.

4. **‘සිහි නුවණින් රණ දෙරණට’** යන විද්‍යාලීය තේමා පාඨයට අනුව දේශීය විදේශීය ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්ට ඉතා උසස් මට්ටමේ වෘත්තීමය පුහුණුවක් ලබාදීම මෙන්ම විදෙස් රටවල ත්‍රිවිධ හමුදා නිලධාරීන් සමඟ අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් අන්තර්ජාතික සහයෝගිතාවය වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම මෙම විද්‍යාලය වෙතින් සිදු කරනු ලබන මහඟු කටයුත්තක් වන අතර වර්තමානයට මෙන්ම අනාගතයට උචිත පරිදි නිර්මාණාත්මක ඵලදායී පුහුණු සැළසුම් තුළින් වෘත්තීමය නිපුණත්වයක් ලබාදීම සහ නිවැරදි මාර්ගෝපදේශයන් තුළින් සාර්ථකත්වයට මඟ පෙන්වීම සිදු කරනු ලබන බව අවසන් වශයෙන් සඳහන් කළ යුතුය.

බික්කේජිඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පි පිඑස්සි අයිජි
මේජර් ජෙනරල්
සේනාවිධායක
ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

පටුන

		පිටු අංක
1.	ඉතිහාසය	1 - 2
2.	දැක්ම, මෙහෙවර සහ අරමුණු	2 - 3
3.	මාණ්ඩලික විද්‍යාලයේ සංවිධාන ව්‍යුහය	4 - 6
4.	විෂය නිර්දේශය	6 - 8
5.	පුහුණු ක්‍රියාකාරකම් - ආසේඅමාවි පාඨමාලා අංක 16	8 - 34
6.	පාලන සහ හඅ කාර්ය සම්පාදනය	34 - 40
7.	නිර්දේශ	40
8.	සාමාලෝචනය	40

ඇමුණුම් :

අ.	ගණකාධිකාරිගේ ප්‍රකාශය	අ 1
ආ.	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	ආ 1 - ආ 12
ඇ.	අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය	ඇ
ඈ.	අධ්‍යාපන සංවර්ධන ප්‍රගතිය - කාර්යසාධන වාර්තාව	ඈ 1 - ඈ 4
ඉ.	විගණකාධිපති වාර්තාව	ඉ 1 - ඉ 9

වගු සටහන

				පිටු අංක
වගුව	-	1	පාඨමාලා අංක 16 හදාරන ලද ශිෂ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව	7
වගුව	-	2	පාඨමාලා අංක 16 හදාරන ලද ශිෂ්‍ය නිලධාරීන්ගේ ප්‍රතිඵල	7
වගුව	-	3	වාහන සාරාංශය	35
වගුව	-	4	යුද්ධ හමුදාවට අයත් වාහන විස්තරය	35
වගුව	-	5	නාවික හමුදාවට අයත් වාහන විස්තරයව	35
වගුව	-	6	ගුවන් හමුදාවට අයත් වාහන විස්තරය	36
වගුව	-	7	ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති වාහන විස්තරය	36
වගුව	-	8	කුලී ගෙවීමේ පදනම මත පවරාගෙන ඇති වාහන විස්තරය	36

වාර්ෂික වාර්තාව - 2022
ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

ඉතිහාසය

1. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ප්‍රථමයෙන් යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය වශයෙන් 1998 මාර්තු මස 16 වන දා ශිෂ්‍ය නිලධාරීන් 26 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. එහෙත් විද්‍යාලය නිල වශයෙන් විවෘත කරනු ලැබුවේ එවකට යුධ හමුදාපති ලුතිතන් ජෙනරාල් ආර්එස් දළුවත්ත ආර්ඛබ්ලිව්පි ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එවකට ජනාධිපතිව සිටි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසින් 1998 අගෝස්තු මස 28 වන දිනය.

2. බ්‍රිතාන්‍ය යුධ හමුදා මාණ්ඩලික විදුහලේ ලුතිතන් කර්නල්වරු දෙදෙනෙකුගේ උපදේශකත්වයෙන් බ්‍රිතාන්‍ය මාණ්ඩලික විද්‍යාලීය විෂය මාලාව අනුගමනය කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවය අනුව විෂය නිර්දේශය පිළියෙල කරන ලදි. යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය ආරම්භයේදී මෙම නිලධාරීන් විසින් පුහුණු ලේඛන සැපයීමෙන් හා උපදේශක නිලධාරීන්ගේ උපදේශන හැකියාවන් ප්‍රගුණ කිරීම මඟින් විද්‍යාලයේ සාර්ථකත්වය සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදි.



1998 අගෝස්තු මස 28 දින විද්‍යාලය විවෘත කිරීම

3. තෝරාගත් යුධ හමුදා නිලධාරීන්ගේ අණ සහ මාණ්ඩලික රාජකාරීන්හි වෘත්තීය දැනුම හා අවබෝධය වර්ධනය කිරීමේ අරමුණින් යුධ හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ආරම්භ කරන ලදි. මීට අමතරව ශ්‍රී ලංකා නාවික හා ගුවන් හමුදා නිලධාරීන් කිහිපදෙනෙකු ද මෙම පාඨමාලාවට තෝරාගත් අතර ඔවුන් ද යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය පාඨමාලා අංක 1 සිට පාඨමාලාවන් හදාරන ලදි. 1998 සිට 2006 දක්වා විද්‍යාලය විසින් උපාධිධාරී නිලධාරීන් 252 දෙනෙකු බිහිකළ අතර යුධ හමුදා නිලධාරීන් 208 ක් නාවික හමුදා නිලධාරීන් 22 ක්, ගුවන් හමුදා නිලධාරීන් 21 ක් සහ පොලිස් නිලධාරීන් එක් අයෙකුද ඊට අයත් වූයේය. රටෙහි පැවති ආරක්ෂක තත්ත්වය මත ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ පුහුණුවක අවශ්‍යතාවය දැනී තිබූ බැවින් මාණ්ඩලික විද්‍යාලය විසින් ත්‍රිවිධ හමුදාවන් හට ඒකාබද්ධ යුධ පුහුණු පරිසරයක් ඇති කිරීමෙහිලා යුධ න්‍යාය හා දර්ශනයන් නැවත සංස්කරණය කර වත්මන් තත්ත්වයට ගැළපෙන ඒකාබද්ධ පුහුණු පාඨමාලාවක් සකස් කිරීමට පෙළඹුනි.

4. වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 22 වන දින ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ වැදගත් සංධිස්ථානයක් විය. ලෝකයේ වෙනත් රටවල මෙන් ත්‍රිවිධ හමුදාවන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා එකම ස්ථානයක් ස්ථාපිත කරනු වස් මාණ්ඩලික විද්‍යාලය ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් නිල වශයෙන් **ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ලෙස (ආසේඅමාවි)** ස්ථාපිත කරන ලදි. ඊට සමගාමීව යුධ හමුදා නිලධාරීන් 36 දෙනෙකුගෙන් ද නාවික හමුදා නිලධාරීන් 8 දෙනෙකු සහ ගුවන් හමුදා නිලධාරීන් 10 දෙනෙකුගෙන් ද සමන්විත ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පළමු වන පාඨමාලාව මෙදින ලියාපදිංචි කර ආරම්භ කරන ලදි. පසුව වර්ෂ 2008 අංක 05 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පනත යනුවෙන් හඳුන්වනු ලබන පනත අනුව 2008 පෙබරවාරි මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි



2007 ජනවාරි මස 22 දින ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය විවෘත කිරීම



පැරණි ලාංඡනය



නව ලාංඡනය

"සිහිනුවණින් රණ දෙරණට"

5. ග්‍රීක ඉතිහාසයේ සඳහන් පරිදි ආතර් රජුගේ පුරාවෘත්තවල පැවත එන පරිදි බස්සා ඥාණය පිළිබිඹු කරන පක්ෂියා වශයෙන් හැඳින්වේ. මධ්‍යය යුගයේ එකල විසූ පූජ්‍ය පක්ෂය සහ විද්වතුන්ගේ දැනුම, බුද්ධිය හා පරිණතභාවය පෙන්වන සලකුණක් වූ බස්සා සංකේතාත්මකව භාවිත කර ඇත.

6. රෝම පුරාවෘත්තයන්හි සඳහන් පරිදි යුද්ධයට සහ ප්‍රඥාවට අධිපති ලෙස මිනර්වා දෙවඟන හඳුන්වයි. ඇගේ ප්‍රියතම පක්ෂියා සහ වාහනය වී ඇත්තේ ද බස්සාය. බස්සා ප්‍රඥාවේ සලකුණ ලෙස සලකමින් එම පක්ෂියා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සලකුණ ලෙස සම්මත කරගෙන ඇත. සිහිනුවණින් රණ දෙරණට යන පාඨය පෙරටු කරගෙන යුධ නාවික හා ගුවන් හමුදා නියෝජනය කිරීම සඳහා තැඹිලි වර්ණ පසුතලයක කඩු දෙකක් ද තද නිල් පාට පසුබිමක නැංගුරමකින් ද ලා නිල් පාට පසුබිමක ඇල්බට්‍රොස් පක්ෂියාද සමන්විත එම ත්‍රිත්වය මධ්‍යයේ බස්සා සලකුණු කොට ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විදුහලේ නිල ලාංඡනය පිළියෙල වී ඇත.

<u>දැක්ම</u>

7. තෝරාගත් ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ වෘත්තීය අවබෝධය දියුණු කිරීම හා යුධ හමුදා නිලධාරීන් මේජර්/ලුතිතන් කර්නල් නිලයේ තනතුරු සඳහාත් නාවික හමුදා නිලධාරීන් ලුතිතන් කොමාන්ඩර්/කොමාන්ඩර් තනතුරු සඳහාත්, ගුවන් හමුදා නිලධාරීන් බලසෙණ නායක/වින්ග් කොමාන්ඩර් තනතුර සඳහාත් වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් ඔවුන්ට උචිත මාණ්ඩලික තනතුරු හා පොලිස් නිලධාරීන් තම ආයතනවල අණ හා මාණ්ඩලික තනතුර සඳහා පුහුණු කිරීමද විදුහලේ දැක්ම වේ.

මෙහෙවර

8. ත්‍රිවිධ හමුදාවෙන් තෝරාගත් නිලධාරීන් හට මාණ්ඩලික නිලධාරී දෙවන ශ්‍රේණියේ හා ඊට ඉහළ තනතුරුවල රාජකාරීන් සාර්ථකව ඉටු කරනු වස් අවශ්‍ය දැනුම ලබාදීමටත් ඔවුන් තුළ පෞද්ගලික හා වෘත්තිමය සදාචාරාත්මක සංවර්ධනයක් ඇති කිරීමටත් අණ සහ මාණ්ඩලික පත්වීම්වල ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා හැකියාව ලබාදීම මෙහෙවර වේ.

අරමුණු

9. මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ.

ඇ. යුධ හා සාමකාමී යන අවස්ථාවන් දෙකෙහිදීම ක්‍රියා කළ යුතු ආකාරය හා ඊට අදාළ ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුවත්ව සිටීම.

ආ. ඕනෑම අන්දමක යුධමය මෙහෙයුමකදී හමුදාවක අන්තර්ගත වී ඇති යුධ මූලධර්ම හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම තුළින් පොදුවේ ඒකාබද්ධව ක්‍රියා කිරීම.

ඇ. යුධ හමුදා සේනාංකයක හෝ නාවික හා ගුවන් හමුදාවල ඊට සමාන මට්ටමේ අණදීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණාත්මක දැනුම.

ඈ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි භූමිකාවල ව්‍යුහය, සංවර්ධනය සහ අන්තර් සබඳතා පිළිබඳව දැනුවත් වීම.

ඉ. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් වී ඇති ආකාරය සහ හමුදා දර්ශනය ඊට සම්බන්ධව ඇති අයුරු අවබෝධ කරගැනීම.

ඊ. ශ්‍රී ලංකාවේ හා මිත්‍ර රටවල ආරක්ෂක ප්‍රතිපත්තිවලට බලපෑම් ඇති කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර කරුණු පිළිබඳව විග්‍රහය.

මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් හා සංවිධාන ව්‍යුහය

10. **සංවිධානය:** ආඥේඅමාවි සංවිධාන ව්‍යුහය - **MOD/DEY/09/26/05/01 11 February** 2013 දරන ලිපිය යටතේ ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අනුමත කර ඇත.



11. **කාර්යභාර්ය:** මාණ්ඩලික විදුහලේ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා එයට පැවරී ඇති කාර්යභාර්ය පහත පරිදි වේ.

අ. සන්නද්ධ හමුදාවල නිලධාරීන් මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යාපන පාඨමාලාව සඳහා බඳවා ගැනීම.

ආ. පොලිස් දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හමුදාමය සංවිධානවල සාමාජිකයන් විද්‍යාලීය පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුළත් කරගැනීම.

ඇ. විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය තීරණය කරන පරිදි ආරක්ෂාව සහ යුධ කළමනාකරණය පිළිබඳව හැදෑරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට මුදල් ගෙවා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබාදීම.

ඈ. ඉහත අ, ආ, සහ ඇ ඡේදවල සඳහන් පරිදි එම නිලධාරීන් ලබාගත් කුසලතාවය සහ ප්‍රවීණතාවය ඇගයීම සඳහා විභාග පැවැත්වීම.

12. **කළමනාකරණ මණ්ඩලය:** මාණ්ඩලික විද්‍යාලයේ කළමනාකරණ සහ පරිපාලන කටයුතු සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයට බලය පැවරී ඇති අතර එම මණ්ඩලය ආරක්ෂක අමාත්‍යතුමා විසින් පත්කර ඇත.

අ. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
ආ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි
ඇ. යුද්ධ හමුදාපති
ඈ. නාවික හමුදාපති
ඉ. ගුවන් හමුදාපති
ඊ. ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
උ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති
ඌ. භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු
එ. ආසේඅමාවි සේනාවිධායක
ඒ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ - මණ්ඩල ලේකම්

13. **කළමනාකරණ මණ්ඩල රැස්වීම**: විද්‍යාලයේ පාඨමාලාවේ ගුණාත්මක බවින් ඉහළ නැංවීම සඳහා සහ විදුහලේ යටිතල පහසුකම් නැංවීම අරමුණු කොට ගෙන කළමනාකරණ මණ්ඩලය රැස්වේ. 2022 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් හතරක් පවත්වනු ලැබිය.

14. **විද්‍යාලීය අධ්‍යයන මණ්ඩලය:** විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත වන අධ්‍යයන මණ්ඩලය පත්කර ඇත.

අ. ආසේඅමාවි සේනාවිධායක - සභාපති
ආ. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ නියෝජිතයකු
ඇ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ
ඈ. යුද හමුදා ප්‍රධාන උපදේශක
ඉ. නාවික හමුදාවේ ප්‍රධාන උපදේශක
ඊ. ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශක
උ. ආසේඅමාවි ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 1 - ලේකම්

15. <u>විද්‍යාලීය විගණන හා කළමනාකරණ කමිටුව:</u> විද්‍යාලයේ ගිණුම් හා මූල්‍යමය කළමනාකරණ කටයුතු සම්බන්ධව මෙන්ම අනෙකුත් කටයුතු පිළිබඳව සිදු කරන ලද විගණන කටයුතු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා පහත සඳහන් කමිටුව පත්කර ඇත.

අ. අතිරේක ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය
ආ. ආසේඅමාවි සේනාවිධායක
ඇ. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරියෙකු/නිලධාරිනියක
ඈ. විගණන අධිකාරි - විගණකාධිපති දෙපාර්තුමේන්තුව
ඉ. ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආරක්ෂක අමාත්‍යාංශය
ඊ. බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ - ආසේඅමාවි
උ. කර්නල් පාලන හා භකාස - ආසේඅමාවි
ඌ. ගණකාධිකාරි - ආසේඅමාවි
එ. අභ්‍යන්තර විගණක - ආසේඅමාවි

<u>විෂය නිර්දේශය</u>

16. පාඨමාලාව මාස 3 ක ආරම්භක වාරයකින් දළ අධ්‍යයන වාර 4 කින් ද සමන්විත වේ.

17. පළමුවන වාරය - මූලික අධ්‍යයනය (සති 12) මෙය 2022 ජනවාරි මස 05 දින ආරම්භ කරන ලද අතර, 2022 අප්‍රේල් 09 දින නිමවිය. පහත සඳහන් විෂයන් පළමුවන අධ්‍යයන වාරය තුළ ආවරණය කරන ලදි:

අ. ත්‍රිවිධ හමුදාවන් හි විවිධ අංශ
ආ. සංග්‍රාමික සේවා ආධාර
ඇ. අණදීම, අණදීමේ සහය සහ තීරණ ගැනීම
ඈ. යුධෝපාය ක්‍රියාන්විත හා සටන්
ඉ. බුද්ධි හා මාණ්ඩලික රාජකාරි
ඊ. ප්‍රධාන හා භට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි
උ. භට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි
ඌ. යුද ක්‍රියාන්විත අදියරයන්
එ. පර්යේෂණ ක්‍රමවේදයන්
ඒ. ශ්‍රී ලාංකීය අධ්‍යයන

18. දෙවන වාරය - යුධ ක්‍රියාන්විතයන් (සති 13) මෙය 2022 අප්‍රේල් මස 18 දින සිට 2022 ජූලි මස 29 දින දක්වා පැවැත්විය. මෙම වාරය තුළ ආවරණය වූ විෂය කොටස්:

අ. ගුවන් සටන් ක්‍රම
ආ. ජාත්‍යන්තර සම්බන්ධතා
ඇ. සිවිල් අධිකාරීන් වෙත හමුදා ආධාර
ඈ. යුද ක්‍රියාන්විත අධියර
ඉ. උපක්‍රමික අධ්‍යයන

19. තුන්වන වාරය - යුධ ක්‍රියාන්විත (සති 11) මෙම වාරය 2022 අගෝස්තු 08 සිට 2022 ඔක්තෝබර් 14 දින දක්වා පැවැත් වූ අතර පහත සඳහන් විෂය කොටස් මේ යටතේ ආවරණය කරන ලදි:

අ. ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳව වැඩමුළුව
ආ. ජාත්‍යන්තර සම්බන්ධතා
ඇ. ඒකාබද්ධ මෙහෙයුම්
ඈ. කළමනාකරණය
ඉ. නාවික සටන් ක්‍රම
ඊ. ප්‍රතිත්‍රස්තවාදී ක්‍රියාන්විත මෙහෙයුම්
උ. විදේශ අධ්‍යාපන චාරිකාව.
ඌ. උපක්‍රමික අධ්‍යයන.

20. හතරවන වාරය - කළමනාකරණය හා තාක්ෂණය (සති 7) මෙම වාරය 2022 ඔක්තෝබර් මස 25 දින සිට 2022 දෙසැම්බර් මස 10 දින දක්වා පැවැත්විය. පහත සඳහන් විෂයන් මෙහිදී ආවරණය කරන ලදි.

අ. කළමනාකරණය
ආ. යුද තාක්ෂණය
ඇ. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්
ඈ. ක්‍රියාන්විත සඳහා පුහුණු වීම්
ඉ. ආරක්ෂාව
ඊ. පරිපාලන අධ්‍යයන
උ. න්‍යෂ්ටික ජීව විද්‍යාත්මක හා රසායනික යුද කටයුතු

ආසේඅමාවි පාඨමාලා අංක 16 ක්‍රියාත්මක වීම.

21. ආසේඅමාවි පාඨමාලා අංක 16 හදාරන ලද ශිෂ්‍ය නිලධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

වගුව - 1

යුධ හමුදා	නාවික හමුදා	ගුවන් හමුදා	විදෙස් හමුදා	සිවිල්	මුළු එකතුව
76	26	25	22	-	149

22. පාඨමාලාව හදාරන ලද විදේශ ශිෂ්‍ය නිලධාරීන් පහත සඳහන් පරිදි වේ:

අ. බංගලාදේශය - 3
ආ ඉන්දුනීසියාව - 1
ඇ. මාලදිවයින - 1
ඈ නේපාලය - 2
ඉ. පකිස්ථානය - 3
ඊ. රුවන්ඩාව - 1
උ. සෙනගල් - 1
ඌ. ඉන්දියාව - 3
එ. සැම්බියාව - 1
ඒ. සෞදි අරාබිය - 5
ඔ. ඕමානය - 1

23. **ප්‍රතිඵල:** ආසේඅමාවි පාඨමාලා අංක 16 ට අදාළ ප්‍රතිඵල නිකුත් කෙරුණු අතර එහි සාරාංශය පහත සඳහන් පරිදි වේ.

වගුව - 2

උපාධිය	සහභාගි වූ සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව
පිඑස්සී	149	149
එම්එස්සී	149	139

24. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක 16 අනුමත අධ්‍යයන විෂය නිර්දේශය අනුව මෙහෙයවන ලදී. ත්‍රිවිධ හමුදා උපදේශක නිලධාරීන් හා සුදුසුකම්ලත් කථිකාචාර්යවරුන් විසින් පාඨමාලාව මෙහෙවන ලදී. ආරක්ෂක සේවා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ අධ්‍යයන වැඩසටහන සඳහා සුදුසුකම්ලත් විද්‍යාර්ථීන් විසින් දේශන පවත්වන ලදි. මීට අමතරව ශිෂ්‍ය නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරනු වස් ඔවුන්ව විවිධ වැදගත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත සහ විදෙස් සංචාර සඳහා ද සහභාගි කරවන ලදී.

25. ආසේඅමාවි පාඨමාලා අංක 16 අධ්‍යයන වාර 4 කින් සමන්විත වූ අතර එය පුහුණු ක්‍රියාකාරකම් වලින් සමන්විත වන ලදී.

අ. පුහුණු ක්‍රියාකාරකම් (පළමු වාරයේදී පවත්වන ලද අභ්‍යාස)

(1) යුද හමුදා පුහුණු අංශය

අ. <u>තන්ඩර් බොල්ට් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 22 වනදින විද්‍යාල භූමියේදී පවත්වන ලද අතර බළඇණි ප්‍රහාරයකදී ආධාරක වෙඩි බලය සැලසුම්කරණය පිළිබඳ අවබෝධයක් ශිෂ්‍ය නිලධාරීන් හට ලබාදෙන ලදී.



ආ. <u>හෝල්ඩ් ෆාස්ට් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 20 වන දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන් හට විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර මෙහි අරමුණ වූයේ ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදී ඉංජිනේරු ආධාරක සේනාංක/බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබඳව අවබෝධයක් ශිෂ්‍ය නිලධාරීන් හට ලබා දීමයි.



ඇ. <u>මාස්ටර් රයිටර් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි 20 දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර, එමඟින් විවිධ රාජකාරී සේවා ලිපි ලිවීම සබැඳිව ඇති නීති සහ ක්‍රමවේදයන් පිළිබඳ නිවැරදි හා මනා පුහුණුවක් ඔවුනට ලබා දෙන ලදී.



ඇ. <u>ටැක්ටිකල් නොටේෂන් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ ක්‍රියාන්විතයකදී ක්‍රියාන්විත මැදිරියක් තුළ රාජකාරි කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු විසින් හදිසියේ ඇතිවන තත්වයක් අධ්‍යනය කොට තම අණ දෙන්නා හට එම තත්වය පිළිබඳ ක්‍රියාන්විත වාර්තාවක් සකස් කොට ඉදිරිපත් කිරීම සබැඳිව පෙරහුරුවක් ලබාදීමයි. මෙම අභ්‍යාසය 2022 පෙබරවාරි මස 02 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.



ඉ. <u>කැරවැන් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය මගින් ශිෂ්‍ය නිලධාරීන් හට උපක්‍රමශීලිව ක්‍රියාන්විතයන්ට පෙර හමුදාමය වාහන ගමන් ගැනීම සහ වාහනරැලි සම්බන්ධ මාණ්ඩලික කටයුතු හා සැලසුම්කරණය පිළිබඳ දැනුම ලබාදීම අරමුණ විය. මෙම අභ්‍යාසය 2022 පෙබරවාරි මස 10 දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් විසින් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.



ඊ <u>පැන්ඩෝරා බොක්ස් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ සංක්ෂිප්ත වාර්තාවක් පිළියෙල කිරීම පිළිබඳව දැනුම ලබාදීම හා පෙර පුහුණු සිදුකිරීමයි. මෙම අභ්‍යාසය 2022 පෙබරවාරි මස 24 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් හට විද්‍යාලීය පරිශ්‍රයේදී පවත්වන ලදී.



(2) නාවික හමුදා පුහුණු අංශය

අ. <u>රවුන්ඩ් රොබින් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 13 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරීන්ගේ සිතීමේ සහ තීරණ ගැනීමේ ශක්තිය, ආත්ම විශ්වාසය, නායකත්ව ගුණාංග හා හැකියාවන් වර්ධනය කිරීමත් මහජනතාව ඉදිරියේ ආත්ම විශ්වාසයෙන් යුතුව නායකයෙකු වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි.



ආ. <u>වර්බල් ඩි අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 22 වන දින විද්‍යාල භූමියේදී නාවික හමුදා නිලධාරින් විසින් පවත්වන ලදි. මෙහිදී ශිෂ්‍ය නිලධාරින්ගට කථිකත්වය වර්ධනය කිරීමේ අභ්‍යාසය සිදු කරන ලදි. විෂයට අදාළ කථා පැවැත්වීම තුළින් ඔවුන්ට තමන්ගේ මතකයන් හා විෂය දැනුම සභාවක් තුළදී පැහැදිලිව ඉදිරිපත් කිරීමේ කුසලතාව වර්ධනය කිරීම අරමුණු කර මෙම අභ්‍යාසය පවත්වන ලදි.



ඇ. <u>කිලර් වේල් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 27 වන දින විද්‍යාල පරිශ්‍රයේදි නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් පවත්වන ලදි. මෙහිදි ලබාදි ඇති විෂය පථයක් තුළ කරුණු ගොණුකර තීරණ ගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකෙරේ. එම ගොණුකරගත් කරුණු ශිෂ්‍ය නිලධාරින් විසින් ලිඛිතව හා වාචිකව ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලබයි. මෙහිදි ශිෂ්‍ය නිලධාරින්ගේ විෂය පථයක් තුල කරුණු ගොණු කිරීමේ හැකියාව සහ ඉදිරිපත් කිරීමේ කුසලතාවයන් වර්ධනය කිරීම අරමුණ වේ.



ඇ. මැරිටයිම් ස්ට්‍රැටජි මෙම අභ්‍යාසය 2022 පෙබරවාරි මස 10 දින විද්‍යාල පරිශ්‍රයේදී නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් පවත්වන ලදී. නාවික න්‍යායන් හා උපාය මාර්ග පිළිබඳ දැනුම වර්ධනය කිරීම අරමුණ වේ.



ඉ. කේස් ස්ටඩි ඔන් ඉන්ටර් නැෂනල් මැරිටයිම් ලෝ මෙම අභ්‍යාසය 2022 මාර්තු මස 25 දින නාවික හමුදා නිලධාරීන්ගේ ජාත්‍යන්තර නාවික නීතිය පිළිබඳ සිද්ධි අධ්‍යනය ප්‍රායෝගිකව වර්ධනය කිරීම අරමුණ වේ.



(3) ගුවන් හමුදා පුහුණු අංශය.

අ. ක්ෂණික කථා අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 ජනවාරි මස 12 දින සහ 13 වන දිනයන්වලදී ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාලයේදී පැවැත්විනි. ක්ෂණිකව දෙන ලද මාතෘකාවක් යටතේ තර්කානුකූලව සහ අර්ථාන්විතව කෙටි කාලයක් තුළ කථා කිරීමට පුහුණුවක් ලබාදීම මෙහි අරමුණ විය.



ආ. **විද්වත් කථා අභ්‍යාසය** මෙය 2022 ජනවාරි මස 20 සහ 21 දිනයන්හී දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලද අතර, ඔවුන් හට ලබාදෙන යම් මාතෘකාවක් යටතේ සැලසුම් සහගතව නිවැරදිව අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙහි අරමුණ විය.



ඇ. **සුකාසියා අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 මාර්තු මස 08 දින සිට 2022 මාර්තු මස 10 වන දින දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසය සිදුකරනු ලැබුවේ තනි පුද්ගල අභ්‍යාස පුහුණු කිරීමේ අභිප්‍රාය ඇතිවය. එහිදී යම් මාතෘකාවක් යටතේ නිවැරදිව විස්තර ගොණුකර එය සාර්ථකව ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම අරමුණ විය.



ඇ. **තන්ඩර් ස්ටෝයික් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 මාර්තු මස 18 වන දින සිට 20 වන දින දක්වා ගුවන් ශිෂ්‍ය නිලධාරින් සඳහා පැවතුන අතර එහි අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරින් විසින් ක්‍රියාන්විතයකට ගුවන් බලය ප්‍රායෝගිකව යෙදවීමේ හැකියාවන් ඔප්නැංවීම සඳහා පුහුණුව ලබාදීමයි.



ඉ. ගුවන් පහර අභ්‍යාසය මෙය 2022 මාර්තු මස 25 සහ 26 දිනවලදී ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙහිදී ලබාදෙනු ලබන ගුවන් පහර යුද අභ්‍යාසයක් තුළින් සිසුන් තුළ පවතින පුද්ගලික දක්ෂතාවයන් තනි තනිවම මැන බැලීම හා පුහුණු කිරීමේ අභ්‍යාසයක් ලෙසින් පවත්වන ලදී.



(4). ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ අභ්‍යාසය.

අ. රවුන්ඩ් ටේබල් අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 පෙබරවාරි මස 18 දින සියලු ශිෂ්‍ය නිලධාරීන් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අභ්‍යාසය මඟින් සාකච්ඡා සටහන් ලිවීමේ කුසලතාව වර්ධනය කිරීම අරමුණු විය.



ආ. ටුටෝරියල් එස්ටිමේට් අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 මාර්තු මස 26 වන දින සිට 2022 අප්‍රේල් මස 01 වන දින දක්වා විද්‍යාල පරිශ්‍රයේදී යුධ හමුදා සහ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණු පහත සඳහන් පරිදි විය.

I යුධ ක්‍රියාන්විත සඳහා යුධ ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සඳහා බුද්ධි තොරතුරු රැස්කිරීම සහ එම බුද්ධි තොරතුරු මත සැලසුම් සූදානම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබාදීම.

ii බලසේනා මට්ටමේ යුධ අභ්‍යාසයන් සඳහා යුධ ඇස්තමේන්තු පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රම සහ ඒ පිළිබඳ මාණ්ඩලික දැනුම ලබාදීමත් එය ප්‍රායෝගිකව භාවිතා කිරීමට අවශ්‍ය පුළුල් අවබෝධයක් ලබාදීමත් වේ.



ඇ. **නෝට් බුක් වෙරටන් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 මාර්තු මස 05 වන දින දක්වා විද්‍යාල පරිශ්‍රයේදී යුධ හමුදා සහ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා පවත්වන ලදි. මෙම අභ්‍යාසයේ අරමුණ ඉදිරිපත් කිරීම සම්බන්ධව අවබෝධයක් ලබාදීමත් වේ.



ඈ. දෙවන වාරයේ පවත්වන ලද අභ්‍යාස.

යුධ හමුදා පුහුණු අංශය.

අ. **බාස්ටැක් අභ්‍යාසය** මෙම අභ්‍යාසය ගම්පහ අස්ගිරි රජමහා විහාර ප්‍රදේශයේදී 2022 අප්‍රේල් මස 23 දින සිට 2022 අප්‍රේල් මස 26 දින දක්වා පවත්වන ලදි.මෙහිදී සේනාංක/ බලසේනා මට්ටමේ ආරක්ෂිතව ස්ථානගතවීම පිළිබඳ සැලසුම්කරණ පිළිබඳව පුහුණුව ලබාදීම අරමුණ විය.



ආ. **ෂයිනින් ආමර් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 අප්‍රේල් මස 27 දින විද්‍යාලපරිශ්‍රයේදී යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් පවත්වන ලදි. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ ක්‍රියාන්විත නියෝග සබැඳි අභ්‍යාස සිදු කිරීම.



ඇ. **අපර්කට් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 මැයි මස 06 දින සිට 2022 මැයි මස 08 දින දක්වා යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් නාරම්වල ප්‍රදේශයේ පැවැත්විණි. එහි අරමුණ වූයේ බලසේනා මට්ටමින් ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සැලසුම් පුහුණු කිරීම වේ.



ඇ. **කැරියර් පිජන් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 ජූලි මස 06 දින සිට 2022 ජූලි මස 10 දින දක්වා විද්‍යාල භූමියේදී ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් උදෙසා පවත්වන ලදි. මෙහි අරමුණ වූයේ යුධ න්‍යාය තුළ සේනාංක මට්ටමේ ප්‍රහාරාත්මක හා ආරක්ෂාකාරී මෙහෙයුම් සමගින් උපක්‍රමික යුධ ක්‍රියා පිළිබඳ දැනුමක් ලබාදීමය.



නාවික හමුදා පුහුණු අංශය.

අ. **හාර්ඩ් පන්ච් අභ්‍යාසය** 2022 අප්‍රේල් මස 28 දින දක්වා නාවික ශිෂ්‍ය නිලධාරීන් සඳහා මෙම අභ්‍යාසය විද්‍යාල පරිශ්‍රය තුළ පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ නාවික ශිෂ්‍ය නිලධාරීන් හට නාවික ආධාරක වෙඩි බල සැලසුම් හා ඒ සම්බන්ධව යොදාගත හැකි නව ක්‍රමවේදයන් පිළිබඳව දැනුමක් ලබාදීම වේ.



ආ. **යුලයිසිස් අභ්‍යාසය** මෙය 2022 මැයි මස 02 දින සිට මැයි මස 07 වන දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්වූ අතර එහි අරමුණ වූයේ ක්‍රියාන්විත සැලසුම ක්‍රියාදාමයේදී තාර්කිකත්වයේ වැදගත්කම පිළිබඳ ඔවුන් වෙත අවධාරණය කිරීමයි.



ඇ. **තන්ඩර් ස්ටයික් අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 මැයි මස 24 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ තාක්ෂණික දියුණුව හා නාවික යුධ උපාය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමයි.



ඈ. **කොන්ටිකි අභ්‍යාසය** මෙය 2022 ජූලි මස 06 වන දින සිට 2022 ජූලි මස 08 දිනයන්හී නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් කිතුල්ගල සිට කොස්ගම දක්වා වූ ප්‍රදේශයන්හි කැලණි ගඟ ආශ්‍රිතව පැවැත්වුනි. මෙම අභ්‍යාසය පැවැත්වුයේ ශිෂ්‍ය නිලධාරින් තුළ නායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහාත් නිර්මාණශීලිත්වය හා ව්‍යක්තීය නිපුණතාව ඇති කරනු වස් ප්‍රායෝගික අභියෝගාත්මක ක්‍රියාකාරකම් හරහා ඔවුන්ගේ ආත්ම ශක්තිය ඉහළ නැංවීමේ අභිප්‍රායෙනි.



ඒකාබද්ධ අභ්‍යාසයන්

අ. **ඔක්ටොපස් අභ්‍යාසය** මෙය 2022 මැයි මස 12 වන දින සිට 2022 මැයි මස 14 වන දින දක්වා නාවික හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වුයේ මුහුදු හා ගුවන් ක්‍රියාන්විතයන් සැලසුම්කරණය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ අභ්‍යාසයන් ලබාදීමයි.



ආ. **කොන්ක්‍රීට් ජංගල් අභ්‍යාසය** මෙය 2022 මැයි මස 20 දින සිට 2022 මැයි මස 25 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් කුරුණෑගල ඇතුගල ප්‍රදේශයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වුයේ නාගරික පරිසරයකදි ප්‍රහාරක හා ආරක්ෂාකාරී මෙහෙයුම් බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබඳව අවබෝධය ලබා දීමයි.



ඇ. **ගෝල්ඩන් ශිල්ඩ් අභ්‍යාසය** මෙය 2022 මැයි මස 31 දින සිට 2022 ජුනි මස 09 දින දක්වා ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ගලේවෙල දඹුල්ල හා නාවුල ප්‍රදේශයන්හිදි පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වුයේ සේනාංකභා බලසේනා මට්ටමේ ආරක්ෂාකාරී මෙහෙයුම්වලදී තීරණ ගැනීමේ හැකියාව සහ ගුවන් බලය යෙදවීම පිළිබඳ පුහුණුවක් ශිෂ්‍ය නිලධාරින්ට ලබා දීමයි.



ඈ. ෂැඩෝ ඩාන්ස් අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 ජුනි මස 21 දින සිට 2022 ජුලි මස 28 දින දක්වා යුධ හමුදා, ගුවන් හ මුදා හා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන්වෙනුවෙන් විද්‍යාලීය භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණු වුයේ යුධ සැලසුම් පරීක්ෂා කිරීමේ ක්‍රම වේදයක් (War Game) මඟින් සැලසුම් තහවුරු කර ගැනීම සහ සේනාංක මට්ටමේ ඒකාබද්ධ මෙහෙයුම් සැලසුම් කිරීම පුහුණු කිරීමයි.



ඉ. පර්පල් වර්ටල් අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 ජූලි මස 15 දින සිට 2022 ජූලි මස 19 දින දක්වා කාලය තුළ ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් විදුහලේදී පැවැත්විණ. මුහුදේ සහ ගොඩබිම යන උභය මෙහෙයුම් සඳහා පුහුණුවක් ලබාදීම මෙහි අරමුණයි.



ඇ. තුන් වන වාරයේ පවත්වන ලද අභ්‍යාස.

(1) යුධ හමුදා පුහුණු අංශය.

අ. ඉන්ක් බ්ලොට් අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 10 දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණ වුයේ සේනාංකයක මට්ටමේ ප්‍රහිත්‍රස්ථවාදී ක්‍රියාන්විත සඳහා හට පිරිස් යෙදවීම සැලසුම් සකස් කිරීම පිළිබඳව අවබෝධයක් ලබා දීමයි.



(2) නාවික හමුදා පුහුණු අංශය.

අ. <u>සැලමැන්ඩර් අභ්‍යාසය</u> මෙය 2022 සැප්තැම්බර් මස 23 වන දින සිට 2022 සැප්තැම්බර් මස 30නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් විදුහල් භූමියේදි සිදු කරන ලද අතර ශිෂ්‍ය නිලධාරින් හට ඒකාබද්ධ යුධ සැලසුම් කිරීම සඳහා පුහුණුවක් ලබාදෙන ලදී.



ආ. <u>ටුයිඩන්ට් අභ්‍යාසය</u> මෙය 2022 අගෝස්තු මස 26 දින සිට 30 දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් ත්‍රිකුණාමලය නාවික හමුදා මුලස්ථානයේදි පවත්වන ලදි. මෙහි අභිප්‍රාය වූයේ ක්‍රියාන්විත සැලසුම් පිළිබඳ පුහුණුවක් ලබාදීමයි.



ඇ. <u>මාර්ලින් ස්පයික් අභ්‍යාසය</u> මෙම අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 26 දින සිට 2022 සැප්තැම්බර් මස 30 දින දක්වා නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදු කරන ලදි. මෙම අභ්‍යාසය කැරලි/ කෝලාහල වැනි හදිසි ආපදා තත්ත්වයන් හීදී නාවික හමුදාව මුහුදු ක්‍රියාන්විත සිදුකලයුතු ආකාරය සම්බන්ධව ශිෂ්‍ය නිලධාරින්ට අවබෝධයක් ඇති කිරීම සඳහා විශේෂයෙන් සකසා ඇත.



ඇ. **මැන්ඔෆ් වෝ අභ්‍යාසය** මෙම අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 08 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදුකරන ලදි මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ නාවික යුධ මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මාණ්ඩලික දැනුම වැඩි දියුණු කිරීමයි.



ඉ. **ප්‍රූඩන්ට් අභ්‍යාසය**. මෙම අභ්‍යාසය 2022 ඔක්තෝබර් මස 05 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදුකරන ලදී. මෙහිදී 2025 වර්ෂය සඳහා වූ නාවික හමුදා උපාය මාර්ග සංකල්පයට සමගාමීව ශිෂ්‍ය නිලධාරින් විසින් අනාගත ශ්‍රී ලංකා නාවික හමුදාවට සුදුසු නෞකාවක ගුණාංග යෝජනා කිරීම සිදුකරන ලදී.



(3) ගුවන් හමුදා පුහුණු අංශය.

අ. **රොක් ඒජස් අභ්‍යාසය**. මෙම අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 27 දින සිට 2022 ඔක්තෝබර් මස 02 දින දක්වා කාලය ගුවන් ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු අතර ගුවන් හමුදා චීන වරාය කඳවුරට ගොස් එහිදී ද මෙම අභ්‍යාසය ප්‍රායෝගිකව හැදෑරූ අතර මෙහි අරමුණ වූයේ කඳවුරු ආරක්ෂක විධිවිධානයන් සැලසුම් කිරීම පිළිබඳව න්‍යායාත්මකව හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමයි.



(4) ඒකාබද්ධ අභ්‍යාසය.

අ. ස්ලෙජ් හැමර් අභ්‍යාසය. මෙම අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 24 සිට 2022 ඔක්තෝබර් මස 01 දක්වා යුධ හා ගුවන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඒකාබද්ධව විදුහලේදී සිදු කරනු ලැබීය. මෙම අභ්‍යාසය මඟින් ක්‍රියාන්විත යුධ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පුහුණුව ලබා දෙන අතර එමඟින් පහත සඳහන් අභ්‍යාස/අධ්‍යයන ලබා දීම සිදු කෙරේ.

i ක්‍රියාන්විත/උපක්‍රමික මට්ටමේ ප්‍රතිත්‍රස්ත යුධ මෙහෙයුම් ක්‍රියා පිළිවෙත් අභ්‍යාස.
ii ප්‍රතිත්‍රස්ත ක්‍රියා පිළිවෙත් සඳහා ආරක්ෂිත යුධ සැළසුම් පිළිබඳව අධ්‍යයනය.
iii යුධ අභ්‍යාස මෙහෙයුම් අභ්‍යාස මඟින් අධ්‍යාපනය ලබාදීම.



ඈ. හතරවන වාරයේදී පවත්වන ලද අභ්‍යාස.

(1) යුද හමුදා පුහුණු අංශය.

අ. ගයිඩින් ලයිට් අභ්‍යාසය. මෙය 2022 ඔක්තෝබර් මස 26 දින සිට 2022 ඔක්තෝබර් මස 28 දින දක්වා විදුහල් භූමියේදී පවත්වන ලද අතර, යුධ හමුදා පුහුණු ප්‍රතිපත්තිවලට අනුව බලසේනා පුහුණු උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා පුහුණුවක් ලබා දීම මෙම අභ්‍යාසයේ අරමුණ විය.



ආ. ගෝස්ට් වෝක් අභ්‍යාසය මෙම අභ්‍යාසය 2022 ඔක්තෝබර් මස 25 වන දින වැලිවේරිය පුගොඩ සහ කිරිඳිවල යන ප්‍රදේශයන්හිදී යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් සිදු කරන ලදී. යුධ ක්‍රමෝපායන් පිළිබඳව භට පිරිස් රහිතව ලිඛිතව බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන යුධ අභ්‍යාසයක් වන අතර එය යුධ මූලධර්ම මත පිහිටා බලඇණි මට්ටමින් සිදු කරනු ලබන අභ්‍යාසයකි.



(2) ඒකාබද්ධ අභ්‍යාස.

ඇ. මැග්නම් ෆෝස් යුද අභ්‍යාසය. මෙය 2022 ඔක්තෝබර් මස 31 දින සිට නොවැම්බර් මස 31 දින දක්වා විදුහල් භූමියේදී පවත්වන ලද අතර මෙය මාණ්ඩලික යුද උපක්‍රමික ක්‍රියාදාමයන්හි මාණ්ඩලික නිලධාරියෙකු නිසි තීරණ ගැනීම සහ විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා පුහුණුවක් ලබා දීම අරමුණු කරගෙන සිදුකරන ලදී.



ඈ. කෘසිබල් අභ්‍යාසය. 2022 නොවැම්බර් මස 14 වන දින සිට 17 වන දින දක්වා ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහල් භූමියේදී සිදු කරන ලදී. හදිසි මහජන අවශ්‍යතාවන් සහ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා කැඳවනු ලැබූ විට එම ක්‍රියාවන් සඳහා සැලසුම් කිරීම මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ පුහුණුවක් ලබා දීම මෙහි අරමුණ වේ.



ඉ. <u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (1 වාරය) පරීක්ෂණ.</u> මෙම පරීක්ෂණ යුධ නාවික සහ ගුවන් හමුදා අංශ යටතේ සිදුකරන ලද අතර මෙහිදී සිදුවන්නේ සෑම අධ්‍යයන වාරයක් තුළම එම වාරය තුළ ඉගෙන ගන්නා ලද විෂයපථයට අනුකූලව ලිඛිත සහ පරිගණක ආශ්‍රිත පරීක්ෂණයන් සිදුකිරීම වේ.

(1) යුධ හමුදා පුහුණු අංශය.

(ආ) මාස්ටර් රයිටර් අභ්‍යාසය 2022 පෙබරවාරි මස 03 දින පවත්වන ලදි.

(ඇ) රවුන්ඩ් ටේබල් අභ්‍යාසය 2022 පෙබරවාරි මස 18 වන දින පවත්වන ලදි.

(2) නාවික හමුදා පුහුණු අංශය.

(අ) මාස්ටර් රයිටර් 2 අභ්‍යාසය 2022 පෙබරවාරි මස 03 වන දින පවත්වන ලදි.

(ආ) රවුන්ඩ් ටේබල් අභ්‍යාසය 2022 පෙබරවාරි මස 18 වන දින පවත්වන ලදි.

(ඇ) අයිඑම්එල් පරීක්ෂණය 2021 මාර්තු 08 දින පවත්වන ලදි.

(3) ගුවන් හමුදා පුහුණු අංශය.

(අ) මාස්ටර් රයිටර් 2. අභ්‍යාසය 2022 පෙබරවාරි මස 03 වන දින දින පවත්වන ලදි.

(ආ) ලයිටිනින් ස්ට්‍රයික් අභ්‍යාසය 2022 අප්‍රේල් මස 29 දින පවත්වන ලදි.

ඊ. **රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (2 වාරය) පරීක්ෂණ.**

(1) යුධ හමුදා පුහුණු අංශය.

(අ) අපර්කට් අභ්‍යාසය 2022 මැයි 13 දින පවත්වන ලදි.

(ආ) ගෝල්ඩන් ෂීල්ඩ් අභ්‍යාසය 2022 ජුනි මස 09 වන දින පවත්වන ලදි.

(ඇ) ෂැඩෝ ඩාන්ස් අභ්‍යාසය 2022 ජුනි මස 29 වන දින පවත්වන ලදි.

(2) නාවික හමුදා පුහුණු අංශය.

(අ) ස්මෝක් ස්ට්‍රෑක් අභ්‍යාසය 2022 අප්‍රේල් මස 29 දින පවත්වන ලදි.

(ආ) යුලිසීස් ක්‍රියාන්විත අභ්‍යාසය 2022 මැයි මස 09 වන දින පවත්වන ලදි.

(3) ගුවන් හමුදා පුහුණු අංශය.

(අ) දඹුමොණරා අභ්‍යාසය 2022 මැයි මස 07 දින පවත්වන ලදි.

(ආ) ගෝල්ඩන් ෂීල්ඩ් අභ්‍යාසය 2022 ජුනි මස 09 වන දින පවත්වන ලදි.

(ඇ) ඩ්‍රැගන් ෆ්ලයි අභ්‍යාසය 2022 ජුලි මස 04 දින පවත්වන ලදි.

උ. **රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (3 වාරය) පරීක්ෂණ.**

(1) යුධ හමුදා පුහුණු අංශය.

(අ) ස්ලෙජ් හැමර් අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 30 වන දින පවත්වන ලදි.

(2) නාවික හමුදා පුහුණු අංශය

(අ) ට්‍රයිඩන්ට් අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 04 දින පවත්වන ලදි.

(ආ) මාර්ලින්ස්පයික් අභ්‍යාසය 2022 ඔක්තෝබර් මස 01 වන දින පවත්වන ලදි.

(3) ගුවන් හමුදා පුහුණු අංශය

(අ) ඇල්බට්‍රොස් අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 24 වන දින පවත්වන ලදි.

(ආ) එයාර් ඩිටරන්ස් අභ්‍යාසය 2022 සැප්තැම්බර් මස 05 වන දින පවත්වන ලදි.

ඌ. **රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (4 වාරය) පරීක්ෂණ.**

(1) යුධ නාවික ගුවන් හමුදා පුහුණු අංශ.

(අ) ගයිඩින් ලයිට් අභ්‍යාසය 2022 ඔක්තෝබර් මස 27 දින සහ 30 දින දක්වා පවත්වන ලදී.

(ආ) සේනාවිධායක ශිෂ්‍ය ගවේෂණ පත් සඳහා වූ ඉදිරිපත් කිරීම හා වාචික පරීක්ෂණය 2022 නොවැම්බර් මස 21 දින සිට 22 දින දක්වා පවත්වන ලදී.

26. සියලුම ශිෂ්‍ය නිලධාරීන් සඳහා ආරක්ෂක උපාධි පාඨමාලාවේ අධ්‍යයන විෂයන් සඳහා පහත සඳහන් විභාග පවත්වන ලදි.

අ. දෙවන වාරය - ශ්‍රී ලාංකික ඉතිහාසය සහ අන්තර් ජාතික කටයුතු විෂය සඳහා විභාගය 2022 අප්‍රේල් මස 25 වන දින සහ මැයි මස 30 වන දින පවත්වන ලදි.

ආ. තුන්වන වාරය - උපාය මාර්ගික අධ්‍යයන විභාගය 2022 අගෝස්තු මස 16 දින පවත්වන ලදි.

ඇ. හතරවන වාරය - කළමනාකරණ අධ්‍යයන විභාගය 2022 ඔක්තෝබර් මස 28 වන දින පවත්වන ලදි.

27. ඉදිරිපත් කිරීම් පාඨමාලා අංක 16 ශිෂ්‍ය නිලධාරීන් විසින් පාඨමාලා කාලය තුළදී පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

අ. 1 වන වාරය.

(1) යුධ නායකයන්ගේ නායකත්වය සහ අණදීම පිළිබඳව අධ්‍යයනය කර ඉදිරිපත් කිරීම (යුධ පුහුණු අංශය). පහත සඳහන් කීර්තිමත් යුධ සෙනෙවිවරුන්ගේ චරිතාපදාන අධ්‍යයනයන් ශිෂ්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදි.

(අ) ජෙනරල් නෝර්මන් ස්වාස්කොෆ්

(ආ) ෆීල්ඩ් මාර්ෂල් එරිෂ් වොන් මන්ස්තෙඉන්

(ඇ) මැරිටල් ඔෆ් ද සෝවියට් යුනියන් ජෙවන් කොනෙවේ

(ඈ) ෆීල්ඩ් මාර්ෂල් ඔගස්ට් වොන් මැකන්සන්

(ඉ) ජෙනරාල් ටොමොයුකි යමශිට

(ඊ) ජෙනරාල් තඩමිචි කුරිබයශි

(උ) මුහම්මඩ් සිඉඅ - උල් හජ්

(ඌ) අහමඩ් ෂහ් මෝස්සොවුඩ් (ලිඔන් ඔෆ් එන්ජ්ශිර්)

(එ) ජෙනරල් ඩග්ලස් මැක්ඇර්තුර්
(ඒ) ෆීල්ඩ් මාර්ශල් එර්වින් රොමෙල්
(ඔ) ටී.ඊ. ලෝරන්ස් (ලෝරන්ස් ඔෆ් ඇරබියා)
(ඕ) ජෙනරාල් ජෝර්ජ් පැට්ටොන්
(ක) ෆීල්ඩ් මාර්ශල් බර්නාර්ඩ් මොන්ට්ගොමේරියි
(ග) මේජර් ජෙනරාල් ශෙස්ට්යි පුල්ලෙර්.
(ව) මෝෂි ඩයන්
(ට) ජෙනරාල් හෙයිනික්ස් ගුඩේරියන්
(ඩ) ඩේවිට් ඩී ඉසෙහොවෙර්.
(ත) ලුතිතන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව
(ද) මේජර් ජෙනරාල් විජය විමලරත්න
(ප) ෆීල්ඩ් මාර්ෂල් සෑම් මනේක්ෂව්

ආ. දෙවන වාරය.

(1) සංග්‍රාම පිළිබඳ අධ්‍යයනයන් ඉදිරිපත් කිරීම. පහත සඳහන් සංග්‍රාම ක්‍රියාන්විත අධ්‍යයනයන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලදි.

(අ) නැපෝලියන්ගේ රුසියාව ආක්‍රමණය (1812)
(ආ) වෝටර්ලූ සටන (1815)
(ඇ) ජර්මානු වසන්ත ප්‍රහාරය (1918)
(ඈ) දෙවන චීන ජපන් යුද්ධය (1937 - 1945)
(ඉ) බෙල්ජියම් සටන (මැයි 1940)
(ඊ) ප්‍රංශ සටන (මැයි - ජූනි 1940)
(උ) මාලිමා මෙහෙයුම (දෙසැම්බර් 1940 - පෙබරවාරි 1941)
(ඌ) මලයානු ව්‍යාපාරය (දෙසැ 1941 - ජනවාරි 1942)
(එ) ජපන් බුරුමය යටත් කර ගැනීම (ජනවාරි - මැයි 1942)
(ඒ) සිංගප්පූරු සටන (පෙබරවාරි 1942)
(ඔ) මිත්‍ර හමුදාව ඉතාලි ආක්‍රමණය (සැප් 1942)
(ඕ) අධි බර මෙහෙයුම් (ජූනි - අගෝස්තු 1944)
(ක) පැරිස් සිට රයින් දක්වා මිත්‍ර පාක්ෂික අත්තිකාරම් (අගෝස්තු - සැප්තැම්බර් 1944)
(ග) නෙදර්ලන්ත සටන (ඔක්තෝබර් - නොවැම්බර් 1944)
(ව) හිරෝෂිමා සහ නාගසාකි බෝම්බ හෙලීම (1945)
(ජ) කොරියානු යුද්ධය (ජූනි 1950 - ජූලි 1953)
(ට) ඩ්‍රැන්ග් නිම්නයේ සටන (නොවැ 1965)
(ඩ) සය දින යුද්ධය (ජූනි 1967)
(ණ) ඇෆ්ගනිස්ථානයේ සෝවියට් ආක්‍රමණය (1979 - 1989)
(ත) Operation Desert Storm (1991)
(ද) ආමේනියානු - අසර්බයිජානියානු යුද්ධය (1994)
(ධ) එක්සත් ජනපදය ප්‍රමුඛ සන්ධානය ඉරාකය ආක්‍රමණය කිරීම (2003)
(න) යුක්‍රේනයේ රුසියානු ආක්‍රමණය (2022)

ඇ. 3 වන වාරය.

(1) ඓතිහාසික සිද්ධි පිළිබඳ අධ්‍යයනයන් ඉදිරිපත් කිරීම (ඒකාබද්ධ) මෙහිදී පහත සඳහන් මාතෘකා යටතේ අධ්‍යයන කර ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

(අ) රෝහින්ග්‍යා ගැටුම
(ආ) උතුරු යේමන් සිවිල් යුද්ධය (1962-1970)
(ඇ) මොසැම්බික් සිවිල් යුද්ධය
(ඈ) බාර්ස්ක් ගැටුම (1959-1960)
(ඉ) රුසියාවේ චෙචන් ගැටුම
(ඊ) තුර්කියේ කුර්දි කැරැල්ල
(උ) මවු නැගිටීම
(ඌ) පේරු අභ්‍යන්තර ගැටුම (1980 - 1992)
(එ) කොලොම්බියානු ගැටුම (1964 - 2015)
(ඒ) පළමු සුඩාන සිවිල් යුද්ධය (Anyanaya කැරැල්ල 1955 - 1972)
(ඔ) එරිත්‍රියානු නිදහස් යුද්ධය (1961 - 1991)
(ඕ) ලිබියානු අර්බුදය (2011 - වර්තමානය)
(ක) සිරියානු සිවිල් යුද්ධය (2011 සිට වර්තමානය දක්වා)
(ග) චිතගොං කඳුකරයේ ගැටුම

ඇ. 4 වන වාරය ශ්‍රී ලංකා කාසි මෙහෙයුම් සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කිරීම්

(අ) රජයේ දේශපාලන මිල සහ අසාර්ථක සාම උත්සාහයන්හි උපායමාර්ගික විශ්ලේෂණයකි.

(ආ) 1988/1989 ජාතික විමුක්ති පෙරමුනෙහි කැරැල්ල

(ඇ) යාපනය අල්ලා ගැනීම - රිවිරැස මෙහෙයුම සහ පවන් මෙහෙයුම සංසන්දනය කිරීම.

(ඈ) වසර 30 ක් ගත වූයේ ඇයි (එල්ටීටීඊ සංවිධානයට) එරෙහි ව්‍යාපාරයේ විවේචනාත්මක විශ්ලේෂණයක්)

(ඉ) මෙහෙයුම් බලවේගය I සහ II
(ඊ) කොටි ගැඹුරු මෙහෙයුම්
(උ) මෙහෙයුම සත්ජය I II III
(ඌ) යාපනය කොටුව වැටලීම සහ ගලවා ගැනීමේ මෙහෙයුම
(එ) පාස්කු ඉරිදා ප්‍රහාරය සහ උගත් පාඩම් සහ ඉදිරි ගමන
(ඒ) දිගන (2018) හි වාර්ගික ප්‍රචණ්ඩත්වය හමුදා යෙදවීම සහ උගත් පාඩම
(ඔ) මුහුදු කොටින්ට එරෙහිව නාවික මෙහෙයුම්.
(ඕ) මුහුදු කොටින්ගේ පරිණාමය මුහුදේ අසමමිතික යුද්ධය: ආරම්භයේ සිට අවසානය දක්වා හරස් මාර්ගය.
(ක) මුහුදු කොටින්ට එරෙහිව ශ්‍රී ලංකා නාවික හමුදාව ගැඹුරු මුහුදේ මෙහෙයුම්: එල්ටීටීඊයේ තීරණාත්මක හැකියාව අක්‍රීය කිරීම.
(ග) එල්ටීටීඊයට එරෙහිව ගුවන් මෙහෙයුම් මෙහෙයවීම ගුවන් හමුදාව - ත්‍රස්තවාදය පරාජය කිරීමට තීරණාත්මක සාධකයක් වන එල්ටීටීඊයේ තීරණාත්මක හැකියාවන් අක්‍රීය කිරීම.
(ච) ඊළාම් යුද්ධයේදී උතුරු හා නැගෙනහිර අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යභාරය.
(ජ) ගුවන් කඳවුරුවලට එරෙහිව එල්ටීටීඊයේ ගොඩබිම් සහ ගුවන තර්ජනය: මුහුණ දෙන අභියෝග සහ ප්‍රතිවිරෝධතා උපාය මාර්ගය.

28. අධ්‍යාපනික වැඩමුළු 2022 වර්ෂයේදී ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක 16 හී ශිෂ්‍ය නිලධාරීන් සඳහා පහත සඳහන් අධ්‍යාපන වැඩමුළු පවත්වන ලදී.

අ. **ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ වැඩමුළුවක්** ICRC නියෝජිත පිරිසක් විසින් 2022 මාර්තු 14 සිට 2022 මාර්තු 16 දක්වා පවත්වන ලදී.

ආ. **ඒකාබද්ධ යුද වැඩමුළුව** 2022 ජූනි 13 සිට 2022 ජූනි 18 දක්වා බංග්ලාදේශයේ මීර්පූර් හී ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජිත පිරිස විසින් පවත්වන ලදී.

ඇ. **යුධ තාක්ෂණික වැඩමුළුව** ආගමික අන්තවාදය සහ රැඩිකල්කරණයට එරෙහි වැඩමුළුව. තුන්වන වාරයේදී 2022 අගෝස්තු 20 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) නියෝජනය කරන ප්‍රසිද්ධ විද්වතුන් විසින් විෂය වැඩමුළුව පවත්වන ලදී.

ඈ. **හමුදා තාක්ෂණ වැඩමුළුව** මිලිටරි තාක්ෂණ පැකේජය 2022 නොවැම්බර් 08 සිට නොවැම්බර් 11 දක්වා ඉන්දියාවේ නියෝජිත පිරිසක් විසින් පවත්වන ලදී.

29. චාරිකා: වැදගත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පිළිබඳ ශිෂ්‍ය නිලධාරීන්ගේ දැනුම පුළුල් කිරීමේ අරමුණින් සංවිධානය කර තිබූ අධ්‍යයන චාරිකා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ අතර කටුනායක ගුවන් හමුදා කඳවුර වෙත අධ්‍යයන චාරිකාවක යෙදෙන ලදී.

අ. 1 වන වාරය

(1) කටුනායක ගුවන් හමුදා කඳවුර වෙත 2022 මාර්තු මස 15 වන දින ශිෂ්‍ය නිලධාරීන් අධ්‍යයන චාරිකාවක යෙදෙන ලදී.



30. **විශේෂ අවස්ථා**

අ. මෙම විද්‍යාලය වෙත විදේශ දූත කණ්ඩායම් චාරිකා කිරීම. පහත සඳහන් විදේශ දූත කණ්ඩායම් 2022 වර්ෂය තුළ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ චාරිකාවන්හි යෙදෙන ලදී.

(1) එක්සත් රාජධානියේ මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් පිජේ කලෙයිටෝන් එම්බීඊ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2022 ජනවාරි මස 27 වන දින විද්‍යාලයේ සංචාරය කරන ලදී.



(2) පකිස්ථානු නාවික හමුදා මාණ්ඩලික යුධ විද්‍යාලයේ කමාන්ඩර් මුහම්මද් ෆහාඩ් මලික් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2022 ජූලි මස 05 දින මෙම විද්‍යාලයේ සංචාරය කරන ලදී.



ආ. **ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරින් මෙම විද්‍යාලයේ චාරිකා කිරීම.** පහත සඳහන් ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරින් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහි 2022 වර්ෂයේදී චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) ගුවන් හමුදාධිපති එයාර් මාෂල් එස්කේ පතිරණ ඩබ්ඩබ්වී ඇන්ඩ් බාර්, ආර්ඩබ්පි ඇන්ඩ් බාර්,ආර්එස්පි බාර්3, විඑස්වී, යුඑස්පි එම්එස්සී, (එම්ඔඒ) යුඑස්ඒ එම්එස්සී, එන්ඩිසි, පිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2022 නොවැම්බර් මස 21 වන දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(2) යුධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පි ආර්එස්පි එන්ඩියු යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2022 දෙසැම්බර් මස 01 වන දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(3) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ජෙනරාල් එල්එච්එස්සි සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වි ආර්ඩබ්ලිව්පි ආර්එස්පි වීඑස්වී යුඑස්පි එන්ඩීසි පීඑස්සි යන ජොෂ්ඨ නිලධාරි 2022 දෙසැම්බර් මස 02 වන දින විද්‍යාලයේ වාරිකාවක යෙදෙන ලදී.



(4) ආරක්ෂක ලේකම් ජෙනරාල් ජීඩීඑච් කමල් ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වි ආර්ඩබ්ලිව්පි ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩීසි පීඑස්සි (විශ්‍රාමික) යන ජොෂ්ඨ නිලධාරි 2022 ඔක්තෝබර් මස 05 වන දින විද්‍යාලයේ වාරිකාවක යෙදෙන ලදී.



31. **විදුහලේ වෙනත් සමාජීය ක්‍රියාකාරකම්.** පහත සඳහන් ක්‍රියාකාරකම් විදුහල තුළ 2022 වර්ෂයේදී පැවැත්විනි.

අ. විද්‍යාලීය ටොම්බෝලා රාත්‍රිය 2022 ජූලි මස වන දින විද්‍යාල භූමියේ පවත්වන ලදී.



ආ. විද්‍යාලීය " වාර්ෂික දිවීමේ තරඟය" 2022 සැප්තැම්බර් මස 12 වන දින නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ඇ. විද්‍යාලීය "හෑෂ් රන්" වැඩසටහන 2022 සැප්තැම්බර් මස 21 වන දින නිළධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ඈ. විද්‍යාලීය "ඩයිනර්ස් ක්ලබ්" වැඩසටහන 2022 නොවැම්බර් මස 10 දින නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ඉ. විද්‍යාලීය "පැන්ටොමයිම්" වැඩසටහන නිලධාරීන්ගේ රංගන කුසලතා එලි දැක්වීම සඳහා 2022 දෙසැම්බර් මස 08 වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



32. **ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු** මෙම විද්‍යාලය මගින් ශිෂ්‍ය නිලධාරින් සඳහා අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබාදී ඇති අතර එමගින් ශිෂ්‍ය නිලධාරින්ගේ කායික හ මානසික ශක්තිය වර්ධනය කර ගනිමින් තම අධ්‍යාපන කටයුතු සංවර්ධනය කර ගැනීමට එමගින් මනා පිටුවහලක් ලැබේ.

අ. විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින් සඳහා පවත්වන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 2022 මාර්තු මස 18 දින බණිජතෙල් නීතිගත සංස්ථාවේ ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී. මේ සඳහා ශිෂ්‍ය නිලධාරින්ගේ සහ ස්ථිර කාර්ය මණ්ඩලයේ පවුලේ සාමාජිකයින්ද සහභාගී වූ අතර ක්‍රීඩා හා විනෝදාස්වාදය සඳහා පවත්වන ලදී.



ආ. විද්‍යාලයේ ශාරීරික යෝග්‍යතා මධස්ථානය.



ඇ. විද්‍යාලයේ ටේබල් ටෙනිස් ක්‍රීඩා පහසුකම්.



ඈ. විද්‍යාලයේ ස්කොෂ් ක්‍රීඩාගාරය.



33. **කාන්තා සමාජය.** විද්‍යාලීය කාන්තා සමාජයේ 2022 වර්ෂය සඳහා සමාරම්භක උත්සවය 2022 මාර්තු මස 13 දින සියලුම නිලධාරීන්ගේ භාර්යාවන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. එකිනෙකාගේ දැනුම බෙදා ගැනීම සහ ත්‍රිවිධ හමුදා නිලධාරී භාර්යාවන් අතර සුහදත්වය වර්ධනය උදෙසා මෙම කාන්තා සමාජය පැවැත්විය.



34. උපාධි ප්‍රදානෝත්සවය. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක 16 උපාධි ප්‍රදානෝත්සවය 2022 දෙසැම්බර් මස 08 දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී පැවැත්විණි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී වූ අතර ත්‍රිවිධ හමුදාධිපතිවරු සහ තවත් විශේෂිත ආරාධිත අමුත්තන් මේ සඳහා සහභාගි විය. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පාඨමාලා අංක 16 හි ත්‍යාග හිමිකරගත් ජයග්‍රාහකයින් පහත සඳහන් පරිදි වේ.

අ. පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් යුධ හමුදා ශිෂ්‍ය නිලධාරියා අතිගරු ජනාධිපති තුමා වෙතින් කුසලතා සම්මාන ලබාගැනීම.



ආ. පාඨමාලාවේ හොඳම සේනාවිධායක සමීක්ෂණ නිබන්ධනය ඉදිරිපත් කල ශිෂ්‍ය නිලධාරියා අතිගරු ජනාධිපති තුමා වෙතින් කුසලතා සම්මාන ලබාගැනීම.



ඇ. නාවික හමුදා ශිෂ්‍ය නිලධාරියෙකු අතිගරු ජනාධිපති තුමා වෙතින් කුසලතා සම්මාන ලබාගැනීම.



ඈ. ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිළධාරියෙකු අතිගරු ජනාධිපති තුමා වෙතින් කුසලතා සම්මාන ලබාගැනීම.



උ. උපාධි ප්‍රදානෝත්සවයේ රාත්‍රී භෝජන සංග්‍රහය. 2022 දෙසැම්බර් මස 10 දින උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් පැවැත්වෙන රාත්‍රී භෝජන සංග්‍රහය අත්තිඩිය ඊගල් ලේක්සයිඩ් හිදී පවත්වන ලදි.



ආසේඅමාවී පාඨමාලා අංක 16 සඳහා ශිෂ්‍ය නිලධාරීන් 149 දෙනෙකු සහභාගී වූ අතර නිලධාරීන් 149 දෙනෙකු පාඨමාලාව සමත්වූ අතර නිලධාරීන් 139 දෙනෙකු කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ආරක්ෂක අධ්‍යන පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා සුදුසුකම් ලබාගන්නා ලදී.

<u>පාලන සහ හට කාර්ය සම්පාදනය.</u>

35. විද්‍යාලයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා පාලන හා හට කාර්ය සම්පාදන අවශ්‍යතා, සියලුම සේවා පහසුකම් විදුහල වෙත ඉල්ලීම සහ ලබාදීම පාලන සහ හට කාර්ය සම්පාදන ශාඛාවේ ප්‍රධාන කාර්යය වේ. කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් කණ්ඩායම්/කණ්ඩ සහ අනුකණ්ඩයන් පාලන සහ හට කාර්ය සම්පාදන ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

අ. ප්‍රසම්පාදන අංශය.
ආ. ලැබීම් පොළ.
ඇ. ප්‍රවාහන අංශය.
ඈ. නිළධාරි නිවස්නය.
ඉ. බනි/සැර නිවස්නය .
ඊ. කෝප්‍රල් සමාජ ශාලාව.
උ. සෙසුනිල භෝජනාගාරය.
ඌ. හට නිවාස කණ්ඩායම.
එ. ඉංජිනේරු අනු ඛණ්ඩය.
ඒ. වෛද්‍ය ආධාරක ඛණ්ඩය.
ඔ. උපකරණ කණ්ඩය.

36. ඉහත කණ්ඩායම්/ඛණ්ඩ සහ අනු ඛණ්ඩයන් මඟින් 2022 වර්ෂය තුළදි ක්‍රියාත්මක වූ සේවාවන් පිළිබඳව විස්තර.

අ. <u>ප්‍රසම්පාදන අංශය</u>. මෙම අංශය මඟින් විදුහලට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නියමිත ප්‍රසම්පාදන නිතිරීති අනුව ලබා ගන්නා ලද අතර මේ සියලු කටයුතු මූල්‍ය රෙගුලාසි අනුව සිදු කරන ලදී. 2022 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පහත සඳහන් පරිදි වේ.

(1) ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම.
(2) බැරැක්ක උපකරණ මිලදී ගැනීම.
(3) ඡායාස්ථ පිටපත් යන්ත්‍ර/ පරිගණක, ශීතකරණ අමතර කොටස් මිලදී ගැනීම.
(4) ප්‍රවාහන අංශය සඳහා අමතර කොටස් මිලදී ගැනීම.
(5) වාහන සේවා සහ අලුත්වැඩියාව.
(6) ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම.
(7) දේශන ගාස්තු සම්භාෂණ හා සැරසිලි වියදම්.
(8) ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම.
(9) සියලුම ඉදිකිරීම් සඳහා භාණ්ඩ මිලදී ගැනීම.

ආ. <u>ලැබීම් පොළ.</u> ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද සියලු භාණ්ඩ නිසි පරිදි ලියාපදිංචි කර ලේඛන ගත කර ඒ සියලු භාණ්ඩ සේනාවිධායකගේ අනුමැතියකින් පසු හට නිවාස ගබඩාව වෙත නිකුත් කරනු ලැබිය.

ඇ. <u>ප්‍රවාහන ඛණ්ඩය.</u>

(1) වාහන සාරාංශය.

වගුව - 3

යුධ	නාවික	ගුවන්	ආරක්ෂක අමාත්‍යාංශයේ	කුලී පදනම් මත
13	5	4	8	15

(2) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සතුව ඇති වාහන පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ.

(අ) යුධ හමුදාව මඟින් ලබාදී ඇති වාහන/ ට්‍රැක්ටර් ට්‍රේලර්.

වගුව - 4

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	යුහ 26138	ටොයෝටා කෝස්ටර් බස් රථය
2	යුහ 26141	ටොයෝටා කෝස්ටර් බස් රථය
3	යුහ 23080	ටාටා 13×13 ට්‍රක් රථය
4	යුහ 4138	ටැෆේ ට්‍රැක්ටර් රථය
5	යුහ 18048	ලැන්ඩ් රෝවර් ජීප් රථය
6	යුහ 21504	මිට්සුබිසි L 300 වෑන් රථය (මූලික අලුත්වැඩියා)
7	යුහ 19072	ඉසුසු ඩබල් කැබ් රථය
8	යුහ 19039	මිට්සුබිසි L 200 කැබ් රථය
9	යුහ 26416	ටාටා ස්ටාර් බස් රථය
10	යුහ 98321	හයිලැක්ස් කැබ් රථය
11	යුහ 23439	ටාටා ට්‍රක් රථය
12	යුහ 18094	ප්‍රාඩෝ ජීප් රථය
13	යුහ 85228	ට්‍රැක්ටර් ට්‍රේලර් රථය
කුලී ගෙවීමේ පදනම් මත යුධ හමුදාව වෙත ලබාදී ඇති වාහන		
14	යුහ 50399	කේඩිඑච් වෑන් රථය
15	යුහ 49935	හයිලැක්ස් කැබ් රථය
16	යුහ 50777	කේඩිඑච් වෑන් රථය
17	යුහ 51685	හයිලැක්ස් කැබ් රථය
18	යුහ 51746	සුසුකි මරුටි ජීප් රථය

(ආ) නාවික හමුදාව වෙතින් ලබාදී ඇති වාහන

වගුව - 5

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	නාහ 6545	නිශාන් බස් රථය
2	නාහ 4858	ජ්ලැටිනා ධා/පැදිය
3	නාහ 7930	හිරෝ හොන්ඩා ධා/පැදිය
4	නාහ 6053	නිශාන් වෑන් රථය
5	නාහ 3001	ටාටා වෑන් රථය

(ඇ) ගුවන් හමුදාව මගින් ලබාදී ඇති වාහන.

වගුව - 6

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	ගුවන් 3627	රෝසා බස් රථය (A/C)
2	ගුවන් 3822	ලංකා අශෝක් ලේලන්ඩ් ට්‍රක් රථය
3	ගුවන් 5530	හීරෝ ග්ලැමර් ධාවන පැදිය
4	ගුවන් 6001	ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් රථය

(ඈ) ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති වාහන

වගුව - 7

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	BEG 1963	බජාජ් ප්ලැටිනා ධාවන පැදිය
2	BEG 2010	බජාජ් ප්ලැටිනා ධාවන පැදිය
3	KR 8591	සුසුකි මරුටි කාර් රථය
4	KR 8614	සුසුකි මරුටි කාර් රථය
5	NA 7343	මිට්සුබිසි පුසෝ බස් රථය
6	NB 1012	අ/ලේ බස් රථය
7	LF 3072	ටාටා ජල බවුසර් රථය
8	RA 8869	240 මැසිපර්සිගන් ට්‍රැක්ටර් රථය

(ඉ) විද්‍යාලය වෙතින් කුලි ගෙවීමේ පදනම මත පවරාගත් වාහන

වගුව - 8

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	KF 1966	බිලුබර්ඩ් කාර් රථය
2	KI 9966	ටොයෝටා කාර් රථය
3	KG 4851	කයිරෝන් ජීප් රථය
4	KW 4345	ප්‍රිමියෝ කාර් රථය
5	CAC 8375	ප්‍රිමියෝ කාර් රථය
6	DAF 1329	ටාටා කැබ් රථය
7	PE 9641	ටොයෝටා වෑන් රථය
8	NC 6665	හයිරැෆ් වෑන් රථය
9	PF 0568	නොහා වෑන් රථය
10	RD 3388	ටැෆේ ට්‍රැක්ටර් රථය

ඈ. <u>නිලධාරි නිවස්නය</u> නිත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 48 දෙනෙකු දේශීය ශිෂ්‍ය නිලධාරීන් 122 දෙනෙකු උපදේශක නිලධාරීන් 41 දෙනෙකු සහ විදේශීය ශිෂ්‍ය නිලධාරීන් 25 දෙනෙකු සඳහා අවශ්‍ය භෝජනාගාර පහසුකම් 2022 වර්ෂයේදී උසස් අන්දමින් සපයා දෙන ලදි.

ඉ. <u>බනී සැරයන් භෝජනාගාරය</u> ත්‍රිවිධ හමුදා බලලත් නිලධාරීන් සහ සැරයන්වරුන් 83 දෙනෙකුගෙන් සමන්විත අතර ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාගන්නා ආහාර සහ නවාතැන් පහසුකම් නිලධාරියෙකුගේ අධික්ෂණය යටතේ ඔවුන් හට සැපයේ.

ඊ. <u>කොනොංනි සමාජ ශාලාව</u> ත්‍රිවිධ හමුදා කොනොංනින් 222 දෙනෙකුගෙන් සමන්විත මෙම සමාජ ශාලාවේ පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

උ. <u>සෙසුනිල භෝජනාගාරය.</u> ත්‍රිවිධ හමුදා සාමාන්‍ය සෙබළුන් 86 දෙනෙකුගෙන් සමන්විත මෙම භෝජනාගාරයේ භෝජනාගාර පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

ඌ. <u>හට නිවාස කණ්ඩය</u> මෙම ඛණ්ඩය මඟින් විදුහලේ නිවාස හා හට නිවාසවල සියලු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සිදුකිරීම වගකීම වන අතර පුහුණු ආධාරක අංශයේ රාජකාරි සඳහා ද දායක වේ. එමෙන්ම පාඨමාලාව සඳහා සහභාගී වන දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරින්ට සහ නිත්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් හට අවශ්‍ය නේවාසික පහසුකම් සපුරාදීමට කටයුතු කරනු ලබයි තවද පාඨමාලාවේ ක්ෂේත්‍ර අභ්‍යාස සඳහා අවශ්‍ය ස්ථාන සකස් කිරීම හා ඒ සඳහා අවශ්‍ය කුඩාරම් සකස් කරදීම වැනි රාජකාරි සිදු කරනු ලබයි.

එ. <u>ඉංජිනේරු සේවා අනු කණ්ඩය</u> විදුහලේ ඉංජිනේරු සේවා අංශයට පහත සඳහන් වගකීම් පැවරේ.

(1) විද්‍යාලයේ ගොඩනැගිලි වලට පහසුකම් සැපයීම හා පුහුණු උපකරණ නිර්මාණය කිරීම හා නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම
(2) ජලය හා විදුලිය සැපයීම
(3) පහත සඳහන් ඉදිකිරීම සහ අලුත්වැඩියා කටයුතු 2022 වර්ෂයේදී සිදුකර ඇත.

(අ) ශිෂ්‍ය නිලධාරින්ගේ නේවාසිකාගාර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ආ) ජල සහ විදුලි පද්ධතිවල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ඇ) ගොඩනැගිලි වල අමානෝ සෙවිලි තහඩු සඳහා තීන්ත අලේප කිරීම.
(ඈ) ශිෂ්‍ය නිලධාරි නේවාසිකාර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ඉ) පුහුණු අවශ්‍යතා සඳහා ඇවැසි භාණ්ඩ සහ උපකරණ සකස් කිරීම.
(ඊ) පාලන අවශ්‍යතා සඳහා ඇවැසි භාණ්ඩ සහ උපකරණ සකස් කිරීම.
(උ) වායුසමන යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.

ඒ. <u>වෛද්‍ය මධ්‍යස්ථානය</u> ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෛද්‍ය මධ්‍යස්ථානය දෛනික බාහිර රෝගී ප්‍රතිකාර සේවාවක් සිදු කරන අතර රෝගීන් සඳහා සුළු ප්‍රතිකාර කරනු ලැබේ. වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් හමුදා රෝහල් වෙත යොමු කරනු ලැබේ. ත්‍රිවිධ හමුදාව මඟින් වෛද්‍ය නිලධාරීන් ත්‍රෛමාසිකව සේවයේ යොදවන ලදි. 2022 වර්ෂය තුළදී ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව/වාර ගණන පහත සඳහන් පරිදි වේ.

(1)	නිලධාරි	-	224
(2)	නිලධාරී පවුල්වල සාමාජිකයින්	-	43
(3)	ත්‍රිවිධ හමුදා සාමාජිකයින් (සෙසුනිල)	-	1126
(4)	සිවිල් සේවකයින්	-	126
(5)	විදේශීය ශිෂ්‍ය නිලධාරීන්	-	18

ඔ. <u>දන්ත වෛද්‍ය සායනය සඳහා</u>

(1)	නිලධාරි	-	65
(2)	නිලධාරී පවුල්වල සාමාජිකයින්	-	10
(3)	ත්‍රිවිධ හමුදා සාමාජිකයින් (සෙසුනිල)	-	131
(4)	සිවිල් සේවකයින්	-	17
(5)	විදේශීය ශිෂ්‍ය නිලධාරීන්	-	09
(6)	සෙසුනිල සාමාජික පවුල්	-	01

ඕ. මීට අමතරව විද්‍යාලීය වෛද්‍ය අංශය මඟින් පහත සඳහන් සේවාවන්ද ඉටුකර ඇත.

(1) වාර්ෂික සහ වාර අවසාන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම.
(2) වෛද්‍ය සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.
(3) බෝවන රෝග සහ වසංගත රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(අ) ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(ආ) අරක්කැමීන් හා භෝජනාගාර සේවකයින් පරීක්ෂාව.
(ඇ) ආසේඅමාවී මාසික වෛද්‍ය පරීක්ෂණ.

37. <u>සුභසාධක පහසුකම්.</u> පහත සඳහන් සුභසාධක පහසුකම් මෙම විද්‍යාලයේ ශිෂ්‍ය නිළධාරින්ල ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත සපයන ලදි.

අ. ජන අවන්හල පහසුකම්.
ආ. සුභ සාධක හා අවන්හල් පහසුකම් දියුණු කිරීම.
ඇ. සේවයට වාර්තා කිරීම සඳහා යාමට සහ ඊමට කිරිබත්ගොඩ සිට විද්‍යාලය දක්වා නොමිලේ බස් සේවාව.

38. <u>ගණකාධිකාරි කාර්යාලය.</u> ආරක්ෂක අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරියෙකු ගණකාධිකාරවරයාගේ තනතුරෙහි රාජකාරි කිරීම සඳහා විද්‍යාලය වෙත ලබා දී තිබුණි. පසුව 2015 ජුලි මස දී ශ්‍රී ලංකා යුධ හමුදාවේ ගණකාධිකාරී නිලධාරියෙකු ගණකාධිකාරී තනතුරෙහි වැඩ භාර ගන්නා ලදි.

අ. ගණකාධිකාරි කාර්යාලය වෙතින් ඉටුකරනු ලබන සේවාවන්.
(1) සෑම මුල්‍ය වර්ෂයකම පෙබරවාරි මස 28 දිනට ප්‍රථම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
(2) වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම.
(3) සියලුම අදායම් සහ වියදම් නිවැරදිව වර්ගීකරණය කිරීම හා වාර්තා කිරීම.
(4) මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම.
(5) ගිණුම් පාලන ක්‍රම ස්ථාපනය කර නඩත්තු කිරීම.
(6) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයල මුදල් අමාත්‍යාංශය දේශීය අදායම් දෙපාර්තුමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම.

(7) නිසි පරිදි මුල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම.

(8) විද්‍යාලයේ සේවය කරන සිවිල් සේවකයින්ගේ මාසික වේතන සකස් කිරීම හා ගෙවීම් කටයුතු සිදු කිරීම.

(9) විද්‍යාලයේ අවසන් ගිණුම්වලට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(10) විද්‍යාලයේ අවශ්‍යතාවය පරිදි වෙනත් ගිණුම් කටයුතු ඉටු කිරීම.

ආ. ගණකාධිකාරි කාර්යාලය ගණකාධිකාරිවරයෙකු සහ කළමණාකාර සහයකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ 2022 මුල්‍ය ප්‍රකාශණය කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතරල මෙයට ඇමුණුම් ආ' වශයෙන් ඇත.

ඇ. 2022 වසරේ වියදම් කර ඇති සියළු වියදම් මුදල් පොත්හි හා නියමිත වැය ශීර්ෂ යටතේ සඳහන් කර ඇත.

39. සිවිල් පරිපාලන කාර්යාලය. 2022.12.31 දින වන විට විද්‍යාලය වෙත බදවා ගන්නා ලද සිවිල් කාර්ය මණ්ඩලය 73 දෙනෙකුගෙන් සමන්විත විය.

(1). සිවිල් පරිපාලන කාර්යාලය මඟින් පහත සඳහන් රාජකාරි කරනු ලබයි.

(අ) සිවිල් කාර්ය මණ්ඩලයේ දෛනික පාලන හා පරිපාලන කටයුතු සිදු කිරීම.
(ආ) පැමිණීමේ හා පිටවීමේ ලේඛනය නඩත්තු කිරීම.
(ඇ) නිවාඩු/කෙටි නිවාඩු ලේඛන පවත්වාගෙන යාම.
(ඈ) රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් සේවක මහතුන් රාජකාරි සඳහා අනියුක්ත කිරීම.

(2) සිවිල් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම, බඳවා ගැනීම සහ බඳවා ගැනීමෙන් අනතුරුව අභ්‍යන්තර අනුයුක්ත කිරීම් සිදු කිරීම.
(3) සිවිල් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය බුද්ධි සේවය වෙතින් ආරක්ෂණ නිෂ්කාශන වාර්තා ලබා ගැනීම.
(4) සිවිල් කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැන්වීම.
(5) සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පවත්වාගෙන යාම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී උපදෙස් ලබාදීම.
(6) විද්‍යාලීය රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් කාර්ය මණ්ඩලය රාජකාරියෙහි යෙදවීමට පියවර ගැනීම.
(7) සිවිල් කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ලබාදීම.
(8) කඳවුරෙන් පිටත අභ්‍යාසයන් පවත්වන අවස්ථාවලදී ඒ සඳහා රාජකාරියෙහි යෙදවූ සිවිල් සේවක මහතුන් හට ගමන් වියදම් දීමනා හා අතිකාල දීමනා ගෙවීම.

ආ. මෙම කාර්යාලය සිවිල් පරිපාලන නිලධාරියෙකු හා කළමනාකරණ සහකරුවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

40. අභ්‍යන්තර විගණන කාර්යාලය.

අ. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධීන ආයතනයක් බවට පත් වූවාට පසු අභ්‍යන්තර විගණන කාර්යාලයක් ගිණුම් අංශයට පරිහානිරව පිහිටුවන ලදි. මෙම කාර්යාලය සේනාවිධායකතුමාට හා කළමනාකරණ මණ්ඩලයට වගකිව යුතුවේ.

ආ. අභ්‍යන්තර විගණන කාර්යාලය ගණකාධිවරයකු (අභ්‍යන්තර විගණක) සහ ගිණුම් ලිපිකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. අභ්‍යන්තර විගණන කාර්යාලයේ කාර්ය භාරය පහත පරිදි වේ.

(1) වාර්ෂික විගණන වාර්තා පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පවතින විගණන ක්‍රියාදාමය කාලීනව ඇගයීම සහ එහි ඇති දුර්වලතා හා ප්‍රතිඵලදායී ක්‍රියාවන් හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෝජනා කිරීම.

(3) විගණන කළමණාකාර කමිටුව කැඳවා මූල්‍යමය වාර්තා තොග වාර්තා සහ අවශ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කර බලා එහි කරුණු අභ්‍යන්තර විගණන වාර්තාවට ඇතුල් කිරීම.

(4) ව්‍යවස්ථානුකූල නීති රීති චක්‍රලේඛණ හා උපදෙස් මාලා නිසි පරිදි ක්‍රියාත්මක කරනවා දැයි පරීක්ෂාකාරිව සිටීම.

(5) මහා භාණ්ඩාගාරය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා අවශ්‍ය නිර්දේශ හා නිගමන පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත තොරතුරු පිළියෙල කිරීම.

ඇ. 2022 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පවත්වා ඇති අතර පැන නැගී තිබූ ගැටළු හඳුනාගෙන එමගින් විදුහලේ අභ්‍යන්තර විගණන පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. 2022 වාර්ෂික වාර්තාව සඳහා වන අභ්‍යන්තර විගණක නිලධාරින්ගේ වාර්තාව ඇමුණුම් 'ඇ' වශයෙන් ඇත.

නිර්දේශ.

41. මෙම විදුහලේ කොමිෂන් නොලත් නිලයින් හට තිබෙන නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ඔවුන් හට සිවි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

42. මෙම විද්‍යාලයේ ආහාර පිසිම සඳහා ඉදිකර ඇති ප්‍රධාන මුළුතැන්ගෙය නවිකරණය කිරීම සිදුකල යුතුව ඇති බැවින් එය සියලුම පහසුකම් සහිතව නවීකරණය කිරීම.

43. මෙම විද්‍යාලය වෙත දැනට තිබෙන ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් ගබඩා පහසුකම් සහිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

44. මෙම විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා දැනට තිබෙන නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ඔවුන් හට නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

45. සෝලා පැනල් ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම.

46. ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් මෙම විද්‍යාලය වෙත ලබාදී තිබූ සැහැල්ලු වාහන 06 ක් හා ධාවන පැදි 02 ක් දැනට ධාවනයට නුසුදුසු තත්ත්වයේ පවතින බැවින් ඒවා ධාවනයෙන් ඉවත් කර ඇත. එබැවින් දැනට ප්‍රවාහන අංශය සතුව ඇති වාහන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන හෙයින් සැහැල්ලු වාහන 2 ක් හා ධාවන පැදි 01 ක් ලබාගත යුතුව ඇත.

47. ප්‍රවාහන අංශය සතුව ඇති වාහන අංගනයේ රථ වාහන නැවැත්වීම සඳහා අවැසි ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන අතර නවතමයෙන් වාහන අංගනයක් ඉදිකිරීම.

48. මෙම විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරී පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය නිලධාරින් හා ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරි/සෙසුනිලයින් හට හදිසි අසනීප තත්ත්වයක් ඇතිවූ අවස්ථාවන්හී රෝහල වෙත යාම සඳහා ගිලන්රථයක අවශ්‍යතාව ඇත.

49. විද්‍යාලයේ දැනට පවතින බේකරි පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා පිටතින් කෙටි ආහාර මිලදී ගනු ලබන අතර ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇත. එබැවින් විදුලි උදුනක් සහිත බේකරියක් ඉදිකිරීම.

සමාලෝචනය

50. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය 2022 වර්ෂයේද කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද කැපී පෙනෙන වර්ධනයක් සහ ප්‍රගතියක් ලබා ගනිමින් විද්‍යාලයේ අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට හැකියාව ලබා ඇත. නවතමයෙන් මිලදී ගන්නා ලද පරිගණක හා යෙදුම් තුළින් විද්‍යාලය තුළ පරිගණක සාක්ෂරතාවය ඉහල යන ලද අතර එමගින් මාර්ග ගත අධ්‍යන හැකියාව ඉහල යන ලදී. 2022 වර්ෂය තුල විශේෂයෙන් සැලසුම් කරන ලද බහුවිධ ක්‍රමවේද මත ලබාගත් අධ්‍යාපන සංවර්ධනය තුළින් ශිෂ්‍ය නිලධාරින්ගේ දැනුම කුසලතා හා ආකල්ප සුවිශේෂී සංවර්ධන දිසාවක් කරා යොමු කිරීමට හැකියාව ලැබිණි. තවද කොවිඩ් 19 වසංගත තත්ත්වය විද්‍යාලය තුළ පාලනය කරමින් අදාල වෛද්‍ය පිළිවෙත් හා නිරෝධායන නීති/රීති නිසි ආකාරව පිළිපදිමින් ඒ පිළිබඳ විධිමත්ව සැලසුම් සකස් කිරීම මඟින් සමස්ත විෂය මාලාවට අනුව පාඨමාලාව පරිපූර්ණව අවසන් කරන ලදී.

ඇමුණුම අ
වාර්ෂික වාර්තාව 2022

ගණකාධිකාරිගේ ප්‍රකාශය

1. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සිය අභිමානවත් මෙහෙවර සාර්ථකව නිම කළ තවත් වර්ෂයක් වශයෙන් 2022 වර්ෂය හැඳින්විය හැකිය. ජාතික අයවැය දෙපාර්තුමේන්තුව මගින් විද්‍යාලය වෙත වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ කාර්යක්ෂමතාවයකින් හා වඩාත් ඵලදායි ලෙස විද්‍යාලීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙහෙයවීමෙහිලා ගිණුම් අංශය විශාල දායකත්වයක් දක්වා ඇත.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාර ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාලව මෙන්ම අනෙකුත් අදාල චක්‍රලේඛයන් මගින් ලබාදී ඇති මගපෙන්වීම හා උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනයන් හිදී ඉදිරිපත් කිරීමට හැකිවී ඇති අතර ඒ මත සිදුකරන ලද විගණන කටයුතුද නියමිත කාල වකවානුව තුලදී අවසන් කිරීමට ඒ නිසා හැකි වී ඇත.

3. එමෙන්ම මූල්‍ය කටයුතු විනිවිධ භාවයකින් මෙන්ම උසස් කාර්යක්ෂමතාවයකින් හැසිරවීම සඳහා අභ්‍යන්තර විගණන අංශය හා එක්ව මනා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමට හා ඒවා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීම තුලින් විද්‍යාලය තුල මනා මූල්‍ය විනයක් ඇති කිරීමටත් සේනාවිධායක තුමාගේ ඇති දර්ශනය සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීමට හැකිවීම සතුටට කරුණකි.

4. පසුගිය වසර හා සසඳන කල මෙහෙයුම් වියදම රු.මි. 167.00 සිට රු.මි. 181.00 දක්වා රු.මි. 14.00 කින් වැඩි වී ඇති අතර මහාභාණ්ඩාගාරය විසින් ලබාදුන් පුනරාවර්ථන ප්‍රතිපාදන උපරිම ඵලදායිතාවයකින් උපයෝජනය කර විද්‍යාලීය මෙහෙයුම් අවශ්‍යතා සම්පූර්ණ කර විද්‍යාලයේ පුහුණු වැඩසටහන් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට දායකත්වය දියහැකි විය. එසේම ප්‍රාග්ධන වියදම රු.මි. 40.00 ක් වියදම්කර විද්‍යාලයේ ගොඩනැගිලි නව්කරණය හා අත්‍යවශය ගෘහ භාණ්ඩ. යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට හැකිවිය .

5. එබැවින් 2022 වර්ෂය තුලින් ලබාගත් අත්දැකීම් තුලින් පැවති අඩුපාඩු පිළිබඳ තවදුරටත් අවධානය යොමුකල යුතු අංශ හඳුනා ගනිමින් 2023 වසරද පෙරට වඩා සාර්ථක වසරක් කිරීමට අරමුණු කර ගනිමු.

එල්ඩීඑස් පෙරේරා
ගණකාධිකාරී

ඇමුණුම ආ
වාර්ෂික වාර්තාව 2022

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
2022 වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 දෙසැම්බර් 31 දිනට රු	2021 දෙසැම්බර් 31 දිනට රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	02	*1,259,978,138.21*	*1,259,978,138.21*
මුළු ජංගම නොවන වත්කම්		***1,259,978,138.21***	***1,259,978,138.21***
අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංගය		***95,000.00***	***95,000.00***
	03	-	
කෙටි කාලීන ආයෝජන		*198,455,892.89*	*7,145,397.24*
ජංගම වත්කම්			
තොගය	04	*20,915,277.01*	*17,463,001.92*
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	05	*3,172,674.87*	*398,993.05*
මුදල් හා මුදල් සමාන දෑ	06	*1,586,784.99*	*54,328,558.18*
ණය		*3,147,598.80*	*3,501,743.22*
ලැබිය යුතු ආදායම්		-	-
මුළු ජංගම වත්කම්		***28,822,335.67***	***75,692,296.37***
මුළු වත්කම්		***1,487,351,366.77***	***1,378,422,975.55***
ස්කන්ධය සහ බැරකම්			
සමුච්චිත අරමුදල	07	*1,276,741,826.02*	*1,230,852,517.27*
තැන්පතු ගිණුම	08	*54,556,409.11*	*7,562,438.45*
වෙනත් ප්‍රතිපාදන	09	-	
පාරිතෝෂික දීමනා		*12,359,540.00*	*12,744,325.00*
නැවත තක්සේරු කිරීමේ සංචිතය	10	*121,150,231.11*	*121,150,231.11*
මුළු ස්කන්ධ හා ජංගම නොවන බැරකම්		***1,464,808,006.24***	***1,372,309,511.83***
ජංගම වගකීම්			
උපචිත වියදම් හා වෙනත් ගෙවිය හුතු වියදම්	11	*3,731,917.65*	*2,952,298.77*
විවිද ණය හිමියන්	12	*18,811,442.88*	*3,161,164.95*
මුළු ජංගම වගකීම්		***22,543,360.53***	***6,113,463.72***
මුළු ස්කන්ධය සහ වගකීම්		***1,487,351,366.77***	***1,378,422,975.55***

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ඉහතින් දක්වා ඇති මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්‍ය සාධනය පිළිබඳ ප්‍රකාශය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම්කරණ පොත්.වාර්තා සහ අනෙකුත් සියලුම ගිණුම්කරණ තොරතුරු වලට අනුකූලව පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසක් වේ.

ජෙනරල් ජීඩීඑච් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වි ආර්ඩබ්පි ආර්එස්පි යුඑස්පි එන්ඩීසී පීඑස්සී එම්පීඑච්අයිඑල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
සභාපති, කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

බිකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පි
මේජර් ජෙනරල්
සේනාවිධායක
ආසේඅමාවි

එච්එල්සී ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
බ්‍රිගේඩියර්
ලේකම්, කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

එලඩීඑස් පෙරේරා
ගණකාධිකාරී
ආසේඅමාවි

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2022 වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

2022. 12. 31 දිනට		2,022.00	2,022.00
	සටහන්	රු.	රු.
රජයේ ප්‍රධාන	13	150,967,675.00	150,289,774.01
වෙනත් ආදායම්	14	179,647,945.89	108,562,604.16
මුළු ආදායම		**330,615,620.89**	**258,852,378.17**
වියදම්			
පුද්ගල වේතන		48,620,404.97	57,564,614.49
සැපයුම් සහ පාරිභෝගික		63,401,356.82	35,155,213.03
නඩත්තු වියදම්	15	7,308,121.47	10,564,874.53
ගිවිසුම්ගත සේවාවන්		51,667,149.44	48,662,644.66
මුළු වියදම		**171,007,032.70**	**151,947,346.71**
ක්ෂයවීම් ගැලපීමට පෙර මෙහෙයුම් අතිරික්තය		159,608,588.19	106,905,031.46
වර්ෂයේ කෂය	16	(72,871,956.69)	(77,945,520.54)
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		**86,736,631.50**	**28,959,510.92**

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2022.12.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල රු.	තැන්පතු ගිණුම රු.	ප්‍රත්‍යාගණන සංචිත ගිණුම	වෙනත් ප්‍රතිපාදන (මූලධන) රු.
2021 .01 .01 දිනට ශේෂය	**1,220,397,177.08**	**7,562,438.45**	**62,703,007.21**	**34,681,610.00**
වර්ෂයේ වැඩිවීම්	34,681,610.00		58,447,223.90	
වර්ෂයේ අඩුවීම්	(53,185,780.43)			(34,681,610.00)
වර්ෂය සඳහා අතිරික්තය	28,959,510.62			
2022. 01. 01 දිනට ශේෂය	**1,230,852,517.27**	**7,562,438.45**	**121,150,231.11**	**-**
වර්ෂයේ වැඩිවීම්	653,085.91	47,089,965.65		-
වර්ෂයේ අඩුවීම්	(41,500,408.66)	(95,994.99)		-
වර්ෂය සඳහා අතිරික්තය	86,736,631.50	-		-
2022. 12. 31 දිනට ශේෂය	**1,276,741,826.02**	**54,556,409.11**	**121,150,231.11**	**-**

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2022 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය		2022 රු	2021 රු
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් වූ මුදල් ප්‍රවාහය			
ලැබීම්		**272,165,490.31**	**161,459,848.92**
රජයේ ප්‍රධාන (පුනරාවර්තන)		150,967,675.00	126,249,000.00
වෙනත් ලැබීම පුනරාවර්තන සහ මූලධන		1,362,830.81	3,456,803.92
විදේශ සිසුන්ගෙ පාඨමාලා ගාස්තු		119,834,984.50	31,754,045.00
වියදම්		**(165,122,519.56)**	**(131,457,739.31)**
පුද්ගල චේතන		(48,039,647.93)	(44,772,777.70)
සැපයුම්කරුවන්ට ගෙවීම්		(58,861,500.91)	(25,272,868.37)
නඩත්තු සඳහා වියදම්		(7,153,274.96)	(10,609,001.46)
ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම්		(51,076,870.76)	(50,816,066.78)
		8,775.00	12,975.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**107,042,970.75**	**3,000,109.61**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම්		(31,850,105.90)	(20,544,779.04)
සංවර්ධන වියදම්	-		(10,780,034.64)
කෙටිකාලීන ආයෝජන		157,884,421.94	(7,145,397.24)
විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම	-		(2,862,051.36)
විදේශීය මුදල් තැම්පතු ආදායම		566,951.15	138,968.04
විදේශ ව්‍යවහාර ගිණුමේ අවසාන ගිණුම්ශේෂය මත විනිමය ලා		1,037.79	755,717.93
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**189,166,538.90**	**(40,437,576.00)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රදාන - (මූලධන)		28,870,000.00	27,184,000.00
වෙනත් ප්‍රදාන - (මූලධන)	-		13,525.00
ආපදා ණය වාරික අයකර ගැනීම්		**1,811,794.96**	1,339,014.36
ආපදා ණය ගෙවීම්		(1,300,000.00)	(2,200,000.00)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**29,381,794.96**	**26,336,539.36**
මුදල් හා මුදල් වලට සමාන දෑ හි සිදු වූ ශුද්ධ වෙනස		(52,741,773,019.00)	15,901,072.66
2022. 01. 01 දින මුදල් හා මුදල් සමාන දෑ		54,328,558.18	38,427,485.52
2022. 12. 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ		**1,586,784.99**	**54,328,558.18**

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ විස්තරාත්මක සටහන්

අ. වාර්තා කරනු ලබන ආයතනය.

(1) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 2008 පෙබරවාරි 18 වන දින සම්මත කරන ලද 2008 අංක 05 දරන පාර්ලිමේන්තු පනත මඟින් 2007 ජනවාරි මස 22 දින ස්ථාපිත කරන ලදී. මෙය එවකට පැවති යුධ හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අනුප්‍රාප්තිකයා ලෙස යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු මස 16 වන දින ස්ථාපිත කරන ලද ආයතනයක් වේ.

(2) විද්‍යාලය සපුගස්කන්ද මාකොල ප්‍රදේශයේ පිහිටා ඇත.

(3) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධීන ආයතනයක් ලෙස පිළිගෙන මූල්‍ය ප්‍රථිපාදන වෙන් කිරීමෙන් අනතුරුව ප්‍රථම වරට 2010 දී මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරන ලදී.

(4) මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ආ. **මූලික කාර්යයන්** විද්‍යාලයේ මූලික කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(1) විද්‍යාලයේ අධ්‍යන පාඨමාලා හැදෑරීම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරින් රාජ්‍යය ආයතන වල නිලධාරින් හා විදේශ හමුදා නිලධාරින් ඇතුලත්කර ගැනීම.

(2) ශිෂ්‍ය නිලධාරින් ඇගයීම සඳහා විභාග පැවැත්වීම.

(3) අධ්‍යන පාඨමාලා සාර්ථකව හැදෑරූ ශිෂ්‍ය නිලධාරින් වෙත සහතික පත් නිකුත් කිරීම සහ පිළිස්සි (psc) නිළ නාමය ප්‍රධානය කිරීම.

ඇ. පිළියෙල කිරීමේ පදනම සහ අනුකූලතා ප්‍රකාශය.

(1) **අනුකූලතා ප්‍රකාශය** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්කීර්න ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය,මුදල් ප්‍රවාහන කරනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශ ගත චැදගත් ගිණුම් කරන ප්‍රතිපත්ති වලින් විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුකූලව SLPSAS මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.විද්‍යාලය මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයට හා ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද වලට අදාල මූල්‍ය ප්‍රකාශණ වලට සමාන ගිණුම් කරන ප්‍රතිපත්ති සකස් කර ඇත.

(2) **මිණුම් දඬු සඳහා පදනම** මූල්‍ය ප්‍රකාශ හා විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මත පිළියෙල කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති මුළු කාල පරිච්ඡේදය පුරාවටම ඒකාකාරීව උපයෝගී කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනයන්හී උද්ධමනකාරී බලපෑම් සඳහා ගැලපුම් කර නොමැත.

(3) භාවිතා කරන සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය. ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා රුපියල් භාවිතා කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරනු ලබන්නේද ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇ. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය.

(1) දේපල පිරියත හා උපකරණ.

(අ) හඳුනා ගැනීම හා මිණුම්දඬු

i. දේපල පිරියත හා උපකරණ මුල් පිරිවැය හෝ ප්‍රත්‍යාගණය කළ අගයෙන් ක්ෂයවීම් අඩුකර දක්වා ඇත. 2010 වර්ෂය ප්‍රථම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා දේපල පිරියත හා උපකරණ 2009.12.31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලදී. වටිනාකමේ තක්සේරුව සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් ඵලදායි ක්ෂයවීම් අනුපාත හා වෙළඳ වටිනාකම සැලකිල්ලට ගෙන සිදුකර ඇත. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවා ඇති අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් දක්වා ඇත.

ii. මාකොළ දකුණ ජාතික යොවුන් මධ්‍යස්ථානයට අයත් "හෙයියන්තුඩුව වත්ත" ඉඩමෙහි මෙම විද්‍යාලය ගොඩනැගිල්ලක් ඉදිකර ඒවා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගනිමින් සිටී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණයෙන් වත්කම් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීමට ගැනීමට උත්සාහ කරමින් සිටින සිතියම සටහන් කර ඇත. 2008 ඇස්තමේන්තුගත වටිනාකමට අනුකූලව වත්කම් අත්පත් කර ගැනීමට ඉදිරි කටයුතු සම්පාදනය කර ඇත

iii. තවමත් අදාළ ආයතනවල නීත්‍යානුකූල අයිතිය යටතේ පවතින ආරක්ෂක අමාත්‍යාංශය (කලින් ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය) සහ ශ්‍රී ලංකා යුද හමුදාව විසින් වෙත පවරා ඇති වාහන දේපළ කම්හල් සහ උපකරණ යටතේ පිළිගෙන ඇත. එම වත්කම් හා සම්බන්ධ අවදානම් සහ ප්‍රතිලාභ විද්‍යාලය විසින් පාලනය කරනු ලබන අතර එම වත්කම්වල ආර්ථික ප්‍රතිලාභ ද විද්‍යාලය විසින් භාවිතා කරනු ලැබේ. එවැනි වාහනවල නීත්‍යානුකූල අයිතිය විද්‍යාලය වෙත ලබා ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.

iv. දේපල පිරියත සහ උපකරණවල පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දරන ඕනෑම වියදමකි.

v. පසුකාලීන පිරිවැය දේපල පිරියත සහ උපකරණ සඳහා ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර එහිදි භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබීම සහ භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විය යුතුය.

(ඇ) ක්ෂයවීම්.

i. දේපල පිරියත හා උපකරණ වල පිරිවැය මත පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ ක්ෂය වෙන්කිරීම් කර ඇත.

ගොඩනැගිලි	2%
යන්තෝපකරණ	12.5%
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	20%
වාහන	20%
පරිගණක සහ උපකරණ	20%
පුස්තකාල පොත් හා ප්‍රකාශන	20%

ii. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් දේපල පිරියත හා උපකරණ වල ඇස්තමේන්තුගත ආයුකාලය සරල මාර්ග ක්‍රම යටතේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. ඉඩම් සහ කෙරිගෙන යන වැඩ සඳහා ක්ෂයවීම් ගණනය කර නොමැත. වර්ෂය තුළ මිලදිගත්/ ඉදිකරන ලද සියලු දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් වෙන්කර ඇත.

iii. වර්ෂය තුළ ඉවත්කරන ලද දේපල පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ගණනය කර නොමැත.

විශේෂ හෙලිදරව් කිරීම

ශුද්ධ වත්කම් යා ක්ෂය වීම් පිළිබඳව වඩාත් විශ්වාස දායක තාර්කික සහ නිවැරදි සංඛ්‍යා ඉදිරිපත් කිරීම සඳහා මුදල් වර්ශය තුල ක්‍ෂය වීම් පහත පරිධි සිදු කරන ලදී.(ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත 16ඡෙද 43 අනුව)

(අ) වර්ශය තුල මිලදී ගැනීම්/ ඉදිකිරීම් සඳහා මිලදී ගත් / ඉදිකල දිනයේ සිට මූල්‍ය වර්ශය අවසානය දක්වා.

(ආ) වර්ශය තුල ස්ථාවර වත්කම් ඉදිරිපත් කිරීම ස්ථාවර වත්කම ඉවත් කළ වර්ශයේ ආරම්භයේ සිට ඉවත් කල දිනය දක්වා.

(ඇ) ඉවත් කිරීම්

i. දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමේදි පැන නගින ලාභ හෝ අලාභ එම අයිතම ඉවත් කරන වර්ෂයේදි විස්තිර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

ii. ඉවත් කරන ලද දේපල පිරියත හා උපකරණ වල පිරිවැය හා සමුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කර ඇත.

(2) **රජයේ ප්‍රදාන සඳහා ගිණුම් කැබිම**

ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 20ට අනුකූලව රාජ්‍ය ප්‍රධාන ගිණුම් ගත කර ඇත.

රාජ්‍ය ප්‍රධාන ආදායමක් ලෙස ඉදිරිපත් කිරීම.

විස්කීර්න ආදායම් ප්‍රකාශයේ රජයේ ප්‍රධාන ආදායමක් ලෙස ඉදිරිපත් කරන අතර එය රාජ්‍ය ප්‍රධාන ලෙස ඉදිරිපත් කර ඇත.

මුලධන වත්කම් අත්පත් කර ගැනිම් හා වැඩිදිවුණු කිරීම වෙනුවෙන් ලබාදෙන ලද මුලධන හා ප්‍රාග්ධන ප්‍රධාන වත්කම්වල ජීව කාලය පදනම් කරගෙන පදනම් කර ගෙන විලම්භීත ආදායම ලෙස විස්කීර්න ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කරයි.

ඇ. රජයෙන්/රජය අනුබද්ධ ආයතන වලින් වර්ෂය තුළදී විද්‍යාලයට ලැබුණු මුල්‍ය නොවන ප්‍රධානටන්හි වටිනාකම වත්කම් හා ප්‍රදාන ලෙස මුල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත.

(3) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය.**

ඒ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව සෘජු ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියල කර ඇත.

ආ. වර්ෂය තුළදී මුලය නොවන ප්‍රදාන ලෙස ලැබුන ප්‍රදානයන් මුදල් ප්‍රවාහ පුකාශය පිලියෙල කිරිමේදි ඇතුලත් නොකරන ලදි.

(4) **වගකිම් හා වෙන්කිරිම්**: මුල්‍ය ප්‍රකාශය පිලියල කිරිමේදි සියලු හදුනාගත් වගකිම් ගිණුම්ගත කර ඇත.

(5) අදායම් හදුනාගැනිම: විද්‍යාලයේ ආදායම් යන්නට පුනරාවර්ථන ස්වාභාවයේ රජයේ ප්‍රදාන හා අනෙකුත් ප්‍රදාන ඇතුලත් වේ. සියලු ආදායම් හා වියදම් උපචිත පදනම අනුව හදුනාගෙන ඇත.

(6) **සේවනක ප්‍රතිලාභ** සිවිල් සේවකයින්ගේ වේගනයෙන් 12% ක් ක් සේවක අර්ථසාධක අරමුදල හා 3% සේවක භාරකාර අරමුදලට විද්‍යාලය විසින් සපයනු ලබයි.

(7) **අනෙකුත් මෙහෙයුම් නොවන වියදම්** මුල්‍ය කාර්යසාධක ප්‍රකාශයේ අතිරික්තය / ඌණතාවය ගණනය කිරීමේදී විද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වූ සියළු වියදම් මෙන්ම මූලධන වත්කම් නඩත්තු සඳහා වූ වියදම්ද සලකා ඇත.

(8) **සංසන්දනාත්මක තොරතුරු** සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම් හා සැසඳීම් කලහැකි වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් අවශ්‍ය පරිදි ඉදිරිපත් කර ඇත.

(9) **මූල්‍යතත්ව ප්‍රකාශණයෙන් දිනට පසු සිදුවීම්** මූල්‍ය තත්ව ප්‍රකාශණයේ දිනට පසුව සිදුවූ ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අවශ්‍ය පරිදි ගැලපීම් නිසි මූල්‍ය ප්‍රකාශනයන්හී සිදුකර ඇත.

(10) **සම්බන්ධිත පාර්ෂවයන්ගේ ක්‍රියාකාරකම්**

(අ) ත්‍රිවිධ හමුදාව වෙතින් ආයතන වශයෙන් නිලධාරින් 116 ක් හා සෙසුනිළයින් 682 ක ප්‍රමාණයක් විද්‍යාලය සඳහා අනුයුක්ත කර ඇති අතර, ඔවුන්ගේ වැටුප් හා දිමනා සඳහා වන වියදම් අදාළ හමුදාවෙන් විසින් දරනු ලබයි. 2022 වර්ෂය සඳහා අදාළ හමුදාවන් විසින් ගෙවනු ලබන දළ වැටුප් හා දිමනා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

	නිළධාරින්	සෙසු නිලයන්	මුළු වැටුප් හා දීමනා
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	59	461	රු 499.778.512.13
ශ්‍රී ලංකා නාවික හමුදාව	10	116	රු 136.830.097.09
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	42	10	රු 155.015.526.51

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාහන 03 ක් විද්‍යාලය වෙත අනුයුක්ත කර ඇති අතර, එම වාහනවල නඩත්තු වියදම් ඔවුන් විසින් දරනු ලැබේ.

සටහන 2: දේපළ, යන්ත්‍ර සහ උපකරණ

විස්තරය	වියදම/වටිනාකම් රු:				
	2022.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ නවාංග සහ සංවර්ධනය	ප්‍රත්‍යාගණනය	වර්ෂය තුළ හමාර කිරීම්	2022. 12 .31 දිනට වටිනාකම්
ඉඩම්	105,838,788.68				105,838,788.68
ගොඩනැගිලි	1,258,930,043.80	3,980,544.19			1,262,910,587.99
යන්ත්‍ර සූත්‍ර	158,215,790.59	13,152,861.98			171,368,652.57
වාහන	31,040,000.00	150,000.00			31,190,000.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	82,587,226.92	9,090,911.04			91,678,137.96
පරිගණක සහ අමතර කොටස	129,915,746.30	11,213,018.00			141,128,764.30
කෙරෙමින් පවතින් වැඩ	-				-
පුස්තකාල පොත්	2,323,809.00				2,323,809.00
සන්නිවේදන සහ වෙනත් ව්‍යාප	**7,517,412.95**	-			7,517,412.95
එකතුව	**1,776,368,818.24**	**37,587,335.21**			**1,813,956,153.45**

විස්තරය	ක්ෂය				
	2022. 01. 01 දිනට ශේෂය	වර්ෂය සඳහා		වර්ෂය තුල	2022. 12 .31 දිනට වටිනාකම්
ඉඩම්	-				-
ගොඩනැගිලි	200,687,529.80	25,520,147.28	-		226,207,677.08
යන්ත්‍ර සූත්‍ර	83,605,811.54	16,136,224.40	(379,203.75)		99,362,832.19
වාහන	28,322,000.00	2,868,000.00	-		31,190,000.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	56,046,724.80	15,110,947.91	-		71,157,672.71
පරිගණක සහ අමතර කොටස	108,389,178.12	11,733,154.51	606,726.00		120,729,058.63
පුස්තකාල පොත්	2,323,809.45		-		2,323,809.45
සන්නිවේදනය සහ වෙනත් ව්‍යා	1,503,482.59	1,503,482.59	-		3,006,965.18
එකතුව	**480,878,536.30**	**72,871,956.69**	**227,522.25**	-	**553,978,015.24**

2022. 12. 31 දිනට ශුද්ධ වත්කම් අගය **1,259,978,138.21**

2022. 12. 31 දිනට ශුද්ධ වටිනාකම් **1,295,490,281.94**

සටහන 4 : තොගය	2022	2021
	රු	රු
ලිපි ද්‍රව්‍ය	14,007,565.01	9,618,538.10
වෙනත් ආසේඅමාවී තොග	675,498.00	406,346.70
ගොඩනැගිලි ද්‍රව්‍ය	5,167,907.00	3,945,457.81
බැරක්ක භාණ්ඩ	1,064,307.00	3,492,659.31
	20,915,277.01	**17,463,001.92**

සටහන 5 ලැබිය යුතු තැම්පතු අයිතිකාර සහ පෙරගෙවුම්	2022	2021
	රු	රු
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් - වාහන රක්ෂණ	-	57,175.10
සේවා ගිවිසුම්	-	17,917.40
තොරතුරු තාක්ෂණය	548,164.93	291,709.32
දුරකථන	-	28,151.23
වෙනත්	-	4,040.00
උත්සව දීමනා	20,000.00	-
විශේෂ දීමනා	**4,887.90**	-
ලැබිය යුතු ආදායම	**2,599,622.04**	-
	3,172,674.87	**398,993.05**

සටහන 6 : මුදල් සහ මුදල් හා සමාන දෑ	2022	2021
	රු	රු
මුදල් ශේෂය ප්‍රාග්ධන	21,886.38	15,867,574.51
මුදල් ශේෂය පුනරාවර්ථන	256,131.05	182,562.57
විදේශීය ව්‍යවහාර ගිණුම්	174,061.06	37,655,509.56
මුදල් ශේෂය ආපදා ණය ගිණුම්	1,134,706.50	622,911.54
	1,586,784.99	**54,328,558.18**

සටහන 7 : සමුච්චිත අරමුදල	2022	2021
	රු	රු
ආරම්භක ශේෂය	1,230,852,517.27	1,220,397,177.00
ගැලපුම්		
ණය හිමි මාරු කිරීම	-	(226,447.69)
ක්ෂය වෙන් කිරීම් නිවැරදි කිරීම	(227,522.25)	(1,859,058.81)
වෙක්පත් අවලංගු කිරීම	163,842.59	
ස්ථාවර වත්කම් ප්‍රාග්ධනී කරනය නිවැරදි කිරීම	150,000.00	
හඳුනා නොගත් රාජේආදා අඩු කිරීම්	243,248.04	
හඳුනා නොගත් තැම්පතු ගිණුමේ ශේෂය	95,994.99	
උපචිත වියදම්	0.20	2,495,388.40
මුදල් පොතේ වැරදි ශක නිවැරදි නිරීම	0.09	-
වෙනත් රාජ්‍ය ප්‍රදාන	-	34,681,610.00
ගැලපුම් වටිනාකම 2021.01.01 දිනට	**1,231,278,080.93**	**1,250,497,892.00**
රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන	(41,272,886.41)	(48,604,885.53)
වර්ෂය සඳහා අතිරික්තය	**86,736,631.50**	**28,959,510.62**
වර්ෂය අවසානයේ ශේෂය	**1,276,741,826.02**	**1,230,852,517.27**

සටහන 8 : තැන්පත් ගිණුම

	2022	2021
	රු	රු
ආරම්භක ශේෂය	7,562,438.45	7,562,438.45
වැඩිපුර ලද පාඨමාලා ගාස්තු	46,854,984.50	
විනිමය අලාභය -වැඩිපුර ලද මුදල	234,981,015.00	
සමුච්චිත අරමුදල සඳහා මාරු කරන ලද වටිනාකම් නිවැරදි කිරීම	(95,994.99)	
	54556409.11	**7,562,438.45**

සටහන 9 : වෙනත් මූලධන

	2022	2021
	රු	රු
ආරම්භක ශේෂය		34,681,610
සමුච්චිත අරමුදල		- 34,681,610
වර්ෂ අවසාන ශේෂය	-	-

සටහන 10 : ප්‍රත්‍යාගනන සංචිතය

	2022	2021
	රු	රු
ආරම්භක ශේෂය	121,150,231.11	62,703,007.21
වර්ෂය තුළ වර්ධනය		58,447,223.90
වර්ෂය තුළ අඩුවීම		
වර්ෂ අවසාන ශේෂවය	**121,150,231.11**	**121,150,231.11**

සටහන 11 : උපචිත සහගෙවිය යුතු වියදම්

	2022	2021
	රු	රු
සංනිවේදන	551,166.91	487,597.70
විදුලිය	1,477,938.03	1,740,871.92
ජලය	577,337.74	710,854.01
තුලි හා බදු මුදල	1,116,699.97	0.33
පුවත්පත්	-	(0.19)
මුද්දර ගාස්තු	8,775.00	12,975.00
	3,731,917.65	**2,952,298.77**

සටහන 12 : විවිධ ණය හිමිවෝ

	2022	2021
	රු	රු
පුද්ගල වේතන	1,190,792.89	225,329.50
සැපයුම් හා පරිභෝජන	6,561,371.51	886,488.02
තවත්තු සේවා	2,444,246.83	
ගිවිසුම්ගත සේවා	1,255,123.95	30,000.00
මූලධන වියදම්- ගෙඩනැගිලි සහ ඉදිකිරීම්	1,772,678.39	1,772,678.39
මූලධන වියදම්- යන්ත්‍ර සූත්‍ර	2,526,981.26	
මූලධන වියදම්- ගෘහ භාන්ඩ සහ කාර්යාල උපකරන	3,060,248.05	
PSPF		246,669.04
	18,811,442.88	**3,161,164.95**

සටහන 13 : රජයේ ප්‍රදාන

	2022	2021
	රු	රු
වර්ෂය තුළ අනුමත වෙන්කිරීම් වියදම් (පුනරාවර්තන)	181,000,000.00	167,000,000.00
මුදා නොහරින ද්‍රව්‍යශීලී මුදල්	(30,032,325.00)	(16,710,225.99)
භාණ්ඩාගාරය වෙතින් මුදල් මුදා හැරීම්	**150,967,675.00**	**150,289,774.01**

සටහන 14 : වෙනත් ලැබීම්

	2022	2021
	රු	රු
කල් දැමූ ආදායම් ප්‍රාග්ධන පිරිනැමීම් මාරු කළා	70,142,886.41	75,788,885.53
පොලී ආදායම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම	3,166,573.19	138,968.04
ස්ථාවර තැම්පතු පොලී රුපියල්	876,041.44	
නුවමාරු ලාභය NRFC A/C	32,316,088.91	755,717.93
ආපදා ණය පොලී	162,538.44	107,066.46
විශේෂ අත්තිකාරම් පොලී	3,816.80	4,389.20
විදේශීය සිසුන්ගේ පාඨමාලා ගාස්තු	72,980,000.70	31,767,577.00
	179,647,945.89	**108,562,604.16**

සටහන 15 : වියදම්

	2022	2021
	රු	රු
පුද්ගල වේතන	**48,620,404.97**	**57,564,614.49**
වැටුප් සහ දීමනා	33,100,564.72	31,910,744.69
	2,988,735.68	
ඒවක අර්ථසාධක අරමුදල්	281,231.96	
වෙනත් දීමනා	10,900,512.61	12,196,799.80
පාරිතෝෂික දීමනා	1,349,360.00	13,457,070.00
සැපයුම් හා පරිභෝජන	**63,401,356.82**	**35,155,213.03**
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	6,486,622.44	7,876,762.69
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	33,997,675.00	12,833,000.00
බෑරුක්ක භාණ්ඩ	9,561,822.00	4,993,877.18
සංග්‍රහ විහදම්	3,798,389.86	2,560,897.94
පුවත්පත්	87,755.00	45,720.00
උපාධි ප්‍රධානෝත්සවය	9,469,092.52	6,844,955.12
නඩත්තු වියදම්	**7,308,121.47**	**10,564,874.53**
වාහන නඩත්තු	1,599,094.91	1,513,040.92
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නඩත්තු	4,240,590.42	3,474,812.25
ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු	238,132.71	4,938,362.68
භූමි නඩත්තුව	282,259.04	265,668.00
නොරතුරු තාක්ෂණය උපකරණ නඩත්තු	429,644.39	89,690.68
සන්නිවේදන උපකරණ නඩත්තු	518,400.00	283,300.00
ගිවිසුම්ගත සේවා	**51,677,149.44**	**48,662,644.66**
සන්නිවේදන	6,271,612.24	6,623,866.91
විදුලිය	23,733,545.53	21,248,811.23
ජලය	7,591,191.82	6,998,910.13
කුලී හා බදු මුදල්	7,418,833.26	7,471,374.92
සනිපාරක්ෂක	1,489,091.25	1,106,129.59
දේශණ ගාස්තු	1,228,500.00	1,854,000.00
වෙනත් විවිධ වියදම්	3,944,375.34	3,359,551.88
	171,007,032.70	**151,947,346.71**

සටහන 16 : ක්ෂයවීම

	2022	2021
	රු	රු
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	**25,520,147.28**	**25,178,600.88**
යන්ත්‍ර සූත්‍ර	16,136,224.00	16,492,271.45
වාහන	2,868,000.00	2,718,000.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපක කාර්යාල උපකරණ	15,110,947.91	14,232,940.99
පරිගණක සහ අමතර කොටස්	**11,733,154.51**	**17,820,224.63**
	1,503,482.59	
වසර සඳහා ක්ෂය වීම		1,503,482.59
	72,871,956.29	**77,945,520.54**

ඇමණුම ඇ
වාර්ෂික වාර්තාව 2022

2022 වාර්ෂික වාර්තාව සඳහා අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය

1. 2022.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අරමුණු ඉටුකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කොට ක්‍රියාවට නැංවීම මෙම අභ්‍යන්තර විගණන අංශයෙහි මූලික කාර්යභාරය විය. එහිදී අභ්‍යන්තර පාලන පද්ධතිය, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම, තොග පාලනය, කළමනාකරණ සැලසුම් වල ඵලදායීතාවය, අවසන් ගිණුම පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම යනාදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වූ පහත කරුණු පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුකරවන ලද අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදීද සාකච්ඡාවට භාජනය කරන ලදී.

අ). 2021 වර්ෂයට අදාළ මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සහ ඉදිරි වර්ෂයේදී වැඩිදියුණු කරගත යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

ආ). විද්‍යාලයේ එක් එක් අංශ/ආයතන විගණනයට භාජනය කරමින් පවතින අඩුපාඩු නිවැරදි කරගැනීමට උපදෙස් ලබාදීම සහ මහපෙන්වීම.

ඇ). ගිණුම්කරණ පද්ධතියේ ඵලදායිතාවය වර්ධනය කරනු වස් ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා මහපෙන්වීම.

ඈ). ප්‍රසම්පාදන කටයුතු වල පවතින අඩුපාඩු සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව එම අඩුපාඩු නිවැරදි කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම.

ඉ). මහාභාණ්ඩාගාරයෙන් අනුමත කරන ලද ප්‍රතිපාදනයන් මත විද්‍යාලයේ පුනරාවර්ථන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කිරීම.

ඊ). විද්‍යාලයේ ගිණුම්කරණ කටයුතු සහ අනෙකුත් කටයුතුවලදී රජයේ චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි අනුගමනය කිරීමට මහපෙන්වීම.

උ). 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කිරීම සහ ඒ අනුව හඳුනාගන්නා ලද අඩුපාඩු ඉදිරි වර්ෂය තුළ නිවැරදි කරගැනීමට උපදෙස් ලබාදීම.

2. ඉහත පෙන්වා දෙන ලද කරුණු පිළිබඳව කළමනාකරණය විසින් අවධානය යොමුකර නිවැරදි කිරීම සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

3. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයෙහි ප්‍රථම, දෙවන සහ තෙවන කාර්තු සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති අතර ඒ සඳහා නිරීක්ෂකයින් ලෙසින් ජාතික විගණන කාර්යාලයෙහි නියෝජිතයින් සහ ආරක්ෂක අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශයේ නියෝජිතයින්ද සහභාගී වෙමින් එම කාර්යයන් සාර්ථක ලෙස ඉටුකර ගැනීමට අවශ්‍ය සහයෝගය දැක්වූ බවද සතුටින් සිහිපත් කරමි.

සී.එස්. හෙට්ටිආරච්චි
අභ්‍යන්තර විගණක

01. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ පළමු වාරයේ සිට හතරවන වාරය දක්වා අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය.

		පළමු අධ්‍යයන වාරය					දෙවන අධ්‍යයන වාරය				
		>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සමාන්‍ය පහල	>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සමාන්‍ය පහල
1.	අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	1.73%	24.16%	56.83%	11.99%	5.28%	3.17%	19.78%	53.49%	16.75%	6.79%
2.	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	100%					100%				

		තුන්වන අධ්‍යයන වාරය					හතරවන අධ්‍යයන වාරය				
		>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සමාන්‍ය පහල	>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සමාන්‍ය පහල
1.	අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	19.19%	36.00%	53.00%	3.19%	0.04%	6.26%	30.86%	48.92%	9.53%	4.42%
2.	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	100%					93.29%				



02. කාර්ය සාධක දර්ශකය (Key Performance)

අ/අ S/No	කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator)	කාර්ය සාධක මිනුම් (Measurement)	ලගාවූ ඉලක්කයන් (Target/Milestone reached)
1.	අධ්‍යාපනික දර්ශකයන් අ. දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන් සහභාගිවන ප්‍රමාණය. ආ. psc සහ (MSc Def & SS) ලබා ගන්නා නිලධාරීන් ප්‍රමාණය. ඇ. පුළුල් පරාසයක් සඳහා වන දැනුම ලබා ගැනීම.	අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරී සහභාගිත්වය වර්ධනය. ආ මාණ්ඩලික පාඨමාලාව සමත්වීමේ ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. ඇ. ආරක්ෂක විද්‍යාවේදී (MSc Def & SS) හිමිගැන්වීම ප්‍රතිශතය ක්‍රමිකව වර්ධනය කිරීම. ඈ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධනය කිරීම. ඉ. ජාත්‍යාන්තර සහභාගිත්වය වර්ධනය කිරීම.	අ. 2022 වර්ෂයේ දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරී සංඛ්‍යාව 149 ක් විය. ආ. උපරිම ශිෂය නිලධාරී සහභාගිත්වයක් පවත්වා ගැනීම. ඇ. විදේශීය ශිෂ්‍ය නිලධාරී සහභාගිත්වය 22 විය. ඈ. විදේශීය සංචාරය (DDICV) හා බංගලාදේශ අණ හා මාණ්ඩලික විද්‍යාලිය නියෝජිත සංචාරය පැවැත්වීම. ඉ. මාර්ගගත දේශණ හා විභාග පැවැත්වීමට අවශ්‍යය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම.
2.	යටිතල පහසුකම් වර්ධනය කිරීම ඇ. පුහුණු උපකරණ සහ පුහුණු අවස්ථා වැඩි කිරීම.	ඊ. තොරතුරු තාක්ෂණ පහසුකම් සංවර්ධනය කිරීම. උ. පුස්ථකාලයේ කියවීමේ පහසුකම් හා ගුණාත්මක භාවය වර්ධනය කිරීම.	ඊ. ශිෂ්‍ය නිලධාරීන් සඳහා පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.මී 7.94 ක වටිනාකමකින් යුත් පුහුණු ආධාරක සහ අනෙකුත් ප්‍රාග්ධන උපකරණ මිලදි ගැනීම සිදුකරන ලදි. උ. පුස්තකාල පහසුකම් වර්ධනය කිරීම.

03. ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය (**Academic Indicator**)

ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය.

අ. මාණ්ඩලික පාඨමාලාවට ත්‍රිවිධ හමුදා නිලධාරී සහභාගිවීමේ වර්ධනය



04. කාර්ය සාධක දර්ශකයේ සඵලතාවය (**Target Reached for Key Performance Indicators)**

අ/අ S/No	කාර්යසාධක දර්ශකය (Key Performance Indicator)	කාර්යසාධක මිණුම් (Measurement)	ලගාවූ ඉලක්කය (Target/Milestone reached)
01	අ. පරිශීලනය කරනු ලබන පොත්හි ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම ආ. පුහුණුවීම් කටයුතු සඳහා ඉදුරාම ඇවැසි නව උපාංගයන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වර්ධනය කිරීම.	අ. 2021 වර්ෂය තුල පැවති පොත් ප්‍රමාණය 13072 ක් වූ අතර එය 2021 වර්ෂය තුලදී 13910 ක් දක්වා වර්ධනය කර ගැනිමට හැකිවිය. සමස්ත පුස්තකාල කටයුතු පරිගණක ජාලගත කරන ලදි. ආ. 2021 වර්ෂයේ තුල පුස්ථකාලය සතුව තිබූ විද්‍යුත් ග්‍රන්ත ප්‍රමාණය 2200 ක් දක්වා වර්ධනය කර ගැනිමට හැකිවිය.	අ. ශිෂ්‍ය නිලධාරින් සඳහා පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.මී 7.94 ක වටිනාකමකින් යුත් පුහුණු ආධාරක සහ අනෙකුත් ප්‍රාග්ධන උපකරණ මිලදි ගැනිම සිදුකරන ලදි.

05. අධ්‍යාපනික සංවර්ධන දර්ශකය
(Academic Development Indicator)

(1) පුස්තකාල පහසුකම් සංවර්ධන වීම.



ආ. <u>මාණ්ඩලික පාඨමාලාව සමත්වීම.</u>



ඇ. <u>ආරක්ෂක විද්‍යාවෙදී **MSc (Defence Studies)** හිමිගැන්වීම.</u>



ඈ. <u>දේශීය සහ විදේශීය ශිෂ්‍ය සහභාගිත්වය.</u> 2022 වර්ෂයේ දේශීය නිලධාරි සංඛ්‍යා 127 ක් වූ අතර විදේශ ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය 22 ක් විය.



ඇමණුම ඉ
වාර්ෂික වාර්තාව 2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීඊඑන්/ඩීඑස්සීඑස්සී/22/04 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 19 දින

සේනාවිධායක
ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
සපුගස්කන්ද

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළොන්නරුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொலன்னறுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polonnawa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රජයේ ප්‍රදාන යටතේ මිලදී ගෙන ඇති දේපල පිරියත හා උපකරණ වලට අදාල රු.1,920,362 ක ක්ෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා විලම්බිත ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂයේ අඩුවෙන් ගිණුම්ගත කරන ලද රු.249,750 ක පාරිතෝෂික දීමනා නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ගිණුමට හර කර තිබීම නිසා පාරිතෝෂික වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපනය වී තිබුණි.

(ඇ) සේනාවිධායක සමුගැනීමේ ඍදය වෙනුවෙන් ගෙවන ලද රු.307,828 ක් විද්‍යාලයේ සංග්‍රහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) එකතුව රු.2,293,012 ක් වූ ප්‍රවර්තන වර්ෂයේ දේශන ශාස්තු,සංග්‍රහ වියදම් හා සිසුයම් මිලදී ගැනීමේ උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඉ) එකතුව රු. 16,696,210 ක් වටිනාකම් වූ ජර්නල් සටහන් 13 ක නිවැරදිකාවය පිළිබඳව ගණකාධිකාරී විසින් සහතික කර නොතිබුණු අතර ජර්නල් වවුවර් ද පිළියෙල කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මාණ්ඩලික විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මාණ්ඩලික විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

7/2

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මාණ්ඩලික විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාණ්ඩලික විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මාණ්ඩලික විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර,මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මාණ්ඩලික විද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල **ඇතුළත්ව ඇත.**

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මාණ්ඩලික විද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ හාර අරමුදල් පනත	විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා දායක මුදල් සේවා නියුක්තිකයන්ගේ හාර අරමුදල වෙත ගෙවා නොතිබුණි. දැනට සේවයේ නියුතු සේවකයන් 64 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල රු.7,583,786 විය.
(ආ) මුදල් රෙගුලාසි 94 (1)	වාර්ෂික බැරකම්, ඇස්තමේන්තු වල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැඳී සිටිය යුතුය. එසේ වුවත් රු.1,200,400 ක වියදම් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළැඹ තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මාණ්ඩලික විද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සමාලෝචිත වර්ෂයේ නේවාසිකාගාර අවශ්‍යතා නිසි ලෙස සැලකිල්ලට නොගෙන මිලදී ගත් රු.9,180,960ක් වූ ප්‍රාග්ධන උපකරණ වලින් රු.1,446,118 ක් වටිනා රෙදි සෝදන යන්ත්‍ර 3 ක් සහ ශීතකරණ 3ක් ඇතුළු තවත් භාණ්ඩ වර්ග 9 කට අදාල විදුලි උපකරණ උපයෝජනයකින් තොරව නිශ්කාර්යව ගබඩා කර තිබුණි.

(ආ) නේවාසිකාගාර අවශ්‍යතා සඳහා ගෘහභාණ්ඩ මිලදී ගැනීමට විද්‍යාලය විසින් ඉදිරිපත් කල පිරිවිතරයන් සඳහා සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කල මිල ගණන් වල ඇතුළත් පිරිවිතරයන් ඇගයීමට ලක් කර නොමැතිව සැපයුම්කරුට අවශ්‍ය භාණ්ඩ සැපයීමට අවස්ථාව සලසා දෙමින් රු.1,822,006 ක් වටිනා ඇණවුම ස්වර්ණ කැලුම් ආයතනය වෙත පිරිනමා තිබුණි. එහිදී මිලදී ගත් රු.350,250 ක් වටිනා කෑම මේස පුටු 30 කළු පැහැති වර්ණයෙන් යුක්ත වීමෙන් නේවාසිකගාර සඳහා එම වර්ණය නොගැලපෙන බව පවසමින් උපයෝජනයකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවතිණි. එසේම මෙම ඇණවුම තුලින් එකතුව රු.565,300 ක් වටිනා ඇඳන් 5ක් සහ මෙට්ට 5 ක් පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් දෙසැම්බර් 28 වන දින එම භාණ්ඩ ආපසු හරවා යවා තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත් කල රු.158,440 ක් වටිනා කාර්ය සාධන ඇපකරය දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි වැඩ නිම්කල දිනය පසුවී දින 28 ක් දක්වා වලංගු වන පරිදි කාර්ය සාධන ඇපකරය ලබා නොගැනීම නිසා විද්‍යාලයට එය මුදල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මාණ්ඩලික විද්‍යාලයේ අවශ්‍යතා සඳහා Heavy duty ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2022 ජනවාරි 26 වන දින පළමුවර ලංසු කැඳවා තිබුණද විද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන පරිදි පිරිවිතර සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූනි 28 වන

දින තෙවන වරටත් ලංසු කැඳවා අදාල ඡායා පිටපත් යන්ත්‍රය රු.2,200,000 කට මිලදී ගෙන තිබුණි. නිවැරදි පිරිවිතර සකස් නොකිරීම නිසා ප්‍රසම්පාදන කටයුතු සඳහා ගතකල කාල ප්‍රමාදය හේතුවෙන් පළමුවර ලංසු කැඳවීමෙදී රු.1,600,000 කට පැවති ඡායා පිටපත් යන්ත්‍රය තෙවන වර ලංසු කැඳවීමෙදී රු.2,200,000 මිලදී ගැනීමෙන් මාණ්ඩලික විද්‍යාලයට රු.600,000 අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) 2022 ඔක්තෝබර් 11 දින විද්‍යාලයේ අවශ්‍යතා සඳහා ඡායාරූප යන්ත්‍රයක් විද්‍යාලයේ ආයතන සභාපති අරමුදල (විභාස) මගින් මුදල් ගෙවා මිලදී ගෙන පසුව එම අරමුදල වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. විභාස අරමුදලින් රු.1,186,480 ක මුදලක් ලබාගෙන භාණ්ඩ මිලදී ගැනීමෙන් අනතුරුව 2022 නොවැම්බර් 08 වන දින ලංසු කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදු කල පසුව ලිපි ගොනුව සකස් කර තිබුණි. ඒ අනුව විද්‍යාලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මෙම ඡායාරූප යන්ත්‍රය මිලදී ගැනීමෙන් අනතුරුව ව්‍යාජ හා කූට ලේඛන සකස් කර ඇති බවත් ඊට අනුබල ලබාදී ඇති බවත් හෝ නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියාකිරීම හෝ එසේ කිරීමට ඉඩ හැර තිබුණු අතර ඒ පිළිබඳව ආයතන සංග්‍රහයේ II කොටස පරිදි කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) රු.මිලියන 133 ක් වැයකර ඉදිකරන ලද සිව් මහල් පුස්තකාල සහ විභාග ශාලා ගොඩනැගිල්ලේ ජල කාන්දු වීමේ ගැටළුව නිසා ඉහල මහලේ විදුලි පද්ධතියට හා බිත්ති වලට විශාල හානියක් සිදු වී පවතින අතර ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොහැකි වී තිබුණි.

(ආ) රටේ පවතින අර්බුදකාරී තත්ත්වය සමඟ මහා භාණ්ඩාගාරය විසින් වියදම් සීමා කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට පටහැනිව මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික නිලධාරි, ත්‍රිවිධ හමුදාපතිවරුන්ගේ පැමිණීම වෙනුවෙන් දින 5 ක් සඳහා රු.1,144,658 ක සංග්‍රහ වියදමක් දරා තිබුණි.

(ඇ) හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

7/9